සැ. යු. - 2010.07.02 වැනි දින පළ වූ අංක 1661 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,662 - 2010 ජූලි මස 09 වැනි සිකුරාදා - 2010.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1250 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1251 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1251 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 90

DVF/RECT/277/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2008 නොවැම්බර් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිතන් කර්නල් ගම්ලත් රාළලාගේ පොඩිරාලහාමිගේ ජයතිලක, ඉසේබ (නි/2296)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

07-207

---

2010 අංක 91

DVF/RECT/288/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරි) කුරුප්පු ආරච්චිගේ දොන් ස්ටැන්ලි අබේවර්ධන කුරුප්පු, ශ්‍රීලකාභ (නි/6002)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

07-206

---

2010 අංක 92

DVF/RECT/286/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිතන් පේදුරු හේවා කංකානම්ලාගේ නිමල් රාජපක්ෂ, ශ්‍රීලයුපොදුසේබ (නි/5948)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

07-243/1

---

2010 අංක 93

DVF/RECT/286/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2010 මාර්තු මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිතන් විජයතිලකගේ ප්‍රසන්න සම්පත් වික්‍රමපාල, ශ්‍රීලයුපොදුසේබ (නි/4973)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

07-243/2

# රජයේ නිවේදන

මගේ අංකය : පීආර්/1/4/71.

## ගැසට් නිවේදනය

ගරු විදේශ කටයුතු ඇමතිතුමන් විසින් 2010 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොළඹ නියුතු ස්වීඩනයේ නිර්වේතනික කොන්සල් ජනරාල් වශයෙන් ක්‍රිස්ටෝපර් නොයෙල් විජ්කරන් සෙල්වනායගම් මහතා සතුටින් පිළිගෙන ඇත.

සී. ආර්. ජයසිංහ,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 ජුනි මස 24 වැනි දින,
කොළඹ 01,
ජනරජ ගොඩනැගිල්ලේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

07-357

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අයි. ජී. ආර්. සී. රොෂාන්.
ගිණුම් අංක : 1057 5314 7084.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජනවාරි මස 26 දාතම හා අංක 1890 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉලිබ්බුලුව ගමඇති රාලලාගේ චමින්ද රොෂාන් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන්ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් නමයයි ශත විසි පහක (රු. 3,33,339.25) මුදලක් 2010 ජනවාරි මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් නමයයි ශත විසි පහක (රු. 3,33,339.25) මුදල 2010 ජනවාරි 13 දින සිට අංක 1890 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන්ලක්ෂ දහනම දහස් පන්සිය විසිහයයි ශත හැට පහක (රු. 3,19,526.65) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1890 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, උඩගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (පෝරුවදණ්ඩ - උප කාර්යාලය) හඳපාන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කැකුණගහවත්ත (කොටසක්)" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. ඒ. පී. ජයසූරිය යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු මස 07 දාතම හා අංක 4099 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 24 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම), නැගෙනහිරට : ඉංගිරියේ සිට පාදුක්ක දක්වා ප්‍රධාන පාර, දකුණට : ලියනගේ චාර්ල්ස් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 23 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0. පර්. 23) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවේශිතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4099 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 174/142 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ලොට් 24 වශයෙන් ලකුණු කොට ඇති ඉහත කී ඉඩම් කොටස පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී හඳපාන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කැකුණගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1972 නොවැම්බර් මස 03 දාතම හා අංක 1679 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 24 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී (පාර සඳහා වෙන් කිරීම), නැගෙනහිරට : ඉංගිරියේ සිට පාදුක්ක දක්වා ප්‍රධාන පාර, දකුණට : ලියනගේ චාර්ල්ස් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට්

23 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0. පර්. 23) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවේශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1679 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 86/155 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/9

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වී. ටී. ප්‍රගාසම්.
ගිණුම් අංක : 0001 5018 6072.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මැයි මස 18 දාතම හා අංක 3695 දරන, උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වීමන් තිමෝති ප්‍රගාසම් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ හතළිස් දහස් අටසිය විසිදෙකයි ශත පනස් නමයයි (රු. 8,40,822.59) මුදලක් 2009 ඔක්තෝබර් මස 19 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අටලක්ෂ හතළිස් දහස් අටසිය විසිදෙකයි ශත පනස් නමයයි (රු. 8,40,822.59) මුදල ද, 2009 ඔක්තෝබර් මස 20 වැනි දින සිට අංක 3695 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ පනස් දහසක (රු. 7,50,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3695 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ (මිරිහාන මිහිඳු මාවත වශයෙන් ඔප්පුවේ සඳහන්) මිරිහාන පිහිටි මිහිඳු මාවත වරිපනම් අංක 18 සහ 18ඒ දරන "මාරගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ඕ. පී. විජේසිංහ යන අය විසින් සාදන ලද 1977 ජූනි මස 09 දාතම හා අංක 1095 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මිහිඳු මාවත, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම පහක් (අ. 0. රූ. 0, පර්. 16.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවේශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1095 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එම් 3061/100 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/10

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ජී. කෝදාගොඩ සහ ආර්. එම්. නන්දාවතී.
ගිණුම් අංක : 1046 5327 2275.

සම්පත් බැංකු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. ආර්. රත්ගම යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජූලි මස 03 දාතම හා අංක 133 දරන, උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගොර්ඩන් කෝදාගොඩ සහ රත්නායක මුදියන්සේලාගේ නන්දාවතී යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී ගොර්ඩන් කෝදාගොඩ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ හැටහතර දහස් හාරසිය තිස් නමයයි ශත දහ අටක (රු. 8,64,439.18) මුදලක් 2010 ජනවාරි මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අටලක්ෂ හැටහතර දහස් හාරසිය තිස් නමයයි ශත දහ අටක (රු. 8,64,439.18) මුදල ද, 2010 ජනවාරි 13 දින සිට අංක

133 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ තිස්තුන් දහස් නමසිය හතලිස් එකයි ශත හතලිහක (රු. 7,33,941.40) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 133 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කුඹල්වෙල කෝරළයේ, හල්පේ ග්‍රාමයේ (FVP36) පිහිටි "පහළගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 05 දාතම හා අංක 6544 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වික්‍රමපාල කෝදාගොඩ සහ පුංචිරාලගේ උරුමක්කාරයින් විසින් හිමිකම් කියනු ලබන ඉඩම්, නැගෙනහිරට : ජී. කෝදාගොඩ සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, පාර (ප්‍රධාන මාර්ගය), දකුණට : පාර (ප්‍රධාන මාර්ගය), සහ බස්නාහිරට : පාර සහ වික්‍රමපාල කෝදාගොඩ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම අටයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 11.82) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවේශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6544 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව J71/327 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/11

---

### සම්පත් බැංකුව පී. එල්. සී.
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වී. ජී. එස්. වසන්ත.
ගිණුම් අංක : 0076 5000 1227.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2006 අප්‍රේල් මස 19 දාතම හා අංක 1441 දරන, ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 14 දාතම හා අංක 3109 දරන හා සී. ජී. අබේවික්‍රම යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් මස 02 දාතම අංක 07 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදාන ගමගේ සුනිල් වසන්ත යන බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහතුන් ලක්ෂ විසි දෙදහස් හාරසිය තිස් හතයි ශත පනස් හයක (රු. 13,22,437.56) මුදලක් 2009 නොවැම්බර් මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහතුන් ලක්ෂ විසි දෙදහස් හාරසිය තිස් හතයි ශත පනස් හයක (රු. 13,22,437.56) මුදල ද, 2009 නොවැම්බර් 13 වැනි දින සිට අංක 1441, 3109 සහ 07 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන්ලක්ෂ පනස් හත් දහස් හත්සිය හැට හතයි ශත අසූහයක (රු. 3,57,767.86) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිහයයි (26%), රුපියල් තුන්ලක්ෂ හැට දෙදහස් තුන්සිය දොළහයි ශත හැට හයක (රු. 3,62,312.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හතරක් (24%) හා තවත් රුපියල් හාර ලක්ෂ තිස්එක් දහස් හැත්තෑ පහයි ශත හැට අටක (රු. 4,31,075.68) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හතරක් (24%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1441, 3109 සහ 07 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, උස්වැටකෙයියාව පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 355/9 දරන හා බලයලත් මානක තැන කේ. එන්. පී. කස්තුරිරත්න යන අය විසින් සාදන ලද 1974 පෙබරවාරි මස 23 දාතම හා අංක 148 දරන පිඹුරේ ලොට් 2හි කොටසක් වන "කැබැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ඩී. ටී. පැට්රික් රෙජිනෝල්ඩ් යන අය විසින් සාදන ලද 1998 අප්‍රේල් මස 02 දාතම හා අංක 8898 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බී. කේ. එම්. රුදිගු යන අයගේ ඉඩම, නැගෙනහිරට : දැන් කුමාර සිරිවර්ධන යන අයට අයිති එම ඉඩමේ කොටසක්, දකුණට : පාර සහ බස්නාහිරට : අංක 148 දරන පිඹුරේ ලොට් 3 සහ ඩී. ඩබ්ලිව්. මයිකල් යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවේශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 8898 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව

බී 607/201 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/12

---

**සම්පත් බැංකුව පී. එල්. සී.**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එම්. එච්. එස්. එම්. ඉක්බාල් සහ එෆ්. එෆ්. නිසාම්ඩීන්.
ගිණුම් අංක : 1045 5309 8956.

සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මැයි මස 28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ජුනි මස 12 දාතම හා අංක 2924 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට, ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගොතටුව, අඹගහ හන්දිය, මුජීඩියා එස්ටේට්, අංක 49හි පදිංචි ෆාතිමා ෆර්සානා නිසාම්ඩීන් සහ මොහොමඩ් හනීෆා සෙයියඩ් මොහොමඩ් ඉක්බාල් යන දෙදෙනා බන්ධනදායීන් වශයෙන් සහ එකී ෆාතිමා ෆර්සානා නිසාම්ඩීන් උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන්ලක්ෂ එක්දහස් එකසිය දාහතයි ශත අනූදෙකක (රු. 3,01,117.92) මුදලක්, 2008 ඔක්තෝබර් මස 23 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්ලක්ෂ එක්දහස් එකසිය දාහතයි ශත අනූදෙකක (රු. 3,01,117.92) මුදල ද, 2008 ඔක්තෝබර් 24 දින සිට අංක 2924 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය නමයයි ශත හැට නමයක (රු. 2,73,609.69) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2924 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහල, කොටිකාවත්ත-මුල්ලේරියා ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, වැල්ලම්පිටිය ග්‍රාමයේ, පළමු පටුමගේ, වරිපනම් අංක 18හි පිහිටි "කනත්තේවත්ත හෙවත් කරුප්පාවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. එල්. එන්. පෙරේරා යන අය විසින් සාදන ලද 1998 පෙබරවාරි මස 12 දාතම හා අංක 552 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 8 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : පළමු පටුමගේ, වරිපනම් අංක 20 දරන පරිශ්‍රයන්, දකුණට : පළමු පටුමගේ වරිපනම් අංක 14/1 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පළමු පටුමගේ, අංක 16 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 7.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 552 අනුව ය.

එකී පිඹුරු අංක 552හි ලොට් 8, පහත මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී වැල්ලම්පිටිය ග්‍රාමයේ, පළමු පටුමගේ, වරිපනම් අංක 18හි පිහිටි "කනත්තේවත්ත හෙවත් කරුප්පාවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ලෝකනාතන් යන අය විසින් සාදන ලද 1972 මාර්තු මස 18 දාතම හා අංක 1199 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට, ලොට් 8 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 (පාර සඳහා වෙන් කිරීම), නැගෙනහිරට : ලොට් 9, දකුණට : ලොට් 11 සහ බස්නාහිරට : ලොට් 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 7.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී පිඹුරු අංක 119 අනුව වෙළුම/පත්‍ර්ඉරුව බී 624/74හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/13

---

**සම්පත් බැංකුව පී. එල්. සී.**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

වී. සිවරාජ්.
ගිණුම් අංක : 0042 5000 0265

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ජූලි මස 25 දාතම හා අංක 3004 දරන හා 2007 මාර්තු මස 20 දාතම හා අංක 3551 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට, ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වීරයියා සිවරාජ් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන්, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහහතර ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය විස්සයි ශත පනස් අටක (රු. 14,43,720.58) මුදලක් 2010 ජනවාරි මස 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහහතර ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය විස්සයි ශත පනස් අටක (රු. 14,43,720.58) මුදල ද, 2010 ජනවාරි 19 දින සිට අංක 3004 සහ 3551 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නමලක්ෂ හැත්තෑහතර දහස් හාරසිය හැත්තෑ හතයි ශත පනස් හයක (රු. 9,74,477.56) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් තුන්ලක්ෂ හැත්තෑහතර දහස් එකසිය හතලිස් නමයයි ශත විසිපහක (රු. 3,74,149.25) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3004 සහ 3551 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හැඳල උප කාර්යාලය (මාටාගොඩ) වෝඩ් අංක 1 හැඳල ගල්ගහදූව පාර පිහිටි බලගල පාර වරිපනම් අංක 151/1 ''කහටගහවත්ත නොහොත් බලගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඒ. පීරිස් යන අය විසින් සාදන ලද 2004 ජූලි මස 28 දාතම හා අංක 4943 දරන පිඹුරේ නිරූපිත, බෙදා වෙන් කොට, සීමා නිර්ණය කොට, ලොට් 2සී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගලගහදූව පාර, නැගෙනහිරට : බලගල පාර, දකුණට : ක්‍රිස්ටෝපර් ගුණතිලකගේ දේපළ සහ බස්නාහිරට : ලොට් 2බී යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හතයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.71) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4943 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව බී 991/183 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/5

---

### සම්පත් බැංකුව පී. එල්. සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ජී. ඩී. නන්දසිරි
ගිණුම් අංක : 1042 5324 0160.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මාර්තු මස 30 දාතම හා අංක 3593 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට, ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගලගෙදරගේ දොන් නන්දසිරි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ පනස් හය දහස් හතලිස් එකයි ශත දහතුනක (රු. 8,56,041.13) මුදලක් 2010 ජනවාරි මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අටලක්ෂ පනස් හය දහස් හතලිස් එකයි ශත දහතුනක (රු. 8,56,041.13) මුදල ද, 2010 ජනවාරි 08 දින සිට අංක 3593 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්ලක්ෂ හැත්තෑතුන් දහස් පනස් නමයයි ශත තිස් හතක (රු. 7,73,059.37) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3593 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (වෑතර උප කාර්යාලය) සිද්දමුල්ල ග්‍රාමයේ පිහිටි ''ඇටඹගහකනත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 01 දාතම හා අංක 5500 දරන පිඹුරේ නිරූපිත, බෙදා වෙන් කොට, සීමා නිර්ණය කොට, ලොට් සී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී, නැගෙනහිරට : අංක 375 දරන පිඹුරේ ලොට් 5, දකුණට : මැද මාවත සහ බස්නාහිරට : ලොට් ඩී යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 12.81) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන්

සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 5500 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එන් 371/37 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/4

---

## සම්පත් බැංකුව පී. එල්. සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

සී. එම්. ඩී. රීස්.
ගිණුම් අංක : 1051 5001 7293

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. විබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2005 අප්‍රේල් මස 12 දාතම හා අංක 556 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට, ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ක්ලෝඩියා මේරි ඩෙවන් රීස් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහසය ලක්ෂ අසූහතර දහස් හාරසිය හැට නවයයි ශත පනස් පහක (රු. 16,84,469.55) මුදලක් 2010 ජනවාරි මස 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහසය ලක්ෂ අසූහතර දහස් හාරසිය හැට නවයයි ශත පනස් පහක (රු. 16,84,469.55) මුදල ද, 2010 ජනවාරි 07 දින සිට අංක 556 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහහතර ලක්ෂ පනස් දෙදහස් හාරසිය පනස් හතරයි ශත පනස් හතක (රු. 14,52,454.57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොලහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 556 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ ජෝර්ජ් ඊ. ද සිල්වා මාවතෙහි පිහිටි "කටුකැලේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. ඩී. අදිහෙට්ටි යන අය විසින් සාදන ලද 2001 මාර්තු මස 23 දාතම හා අංක 3546 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට, සීමා නිර්ණය කොට, ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 64 දරන එම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : වරිපනම් අංක 64 දරන එම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : හල්ලොලුව සිට කටුකැලේ දක්වා ජෝර්ජ් ඊ. ද සිල්වා මාවත සහ බස්නාහිරට : ඩොක්ටර් ජී. සී. මෙන්ඩිස් යන අයගේ දේපළ සහ එකී පිඹුරේ ලොට් 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ අටයි දශම හතයි පහක් (අ. 0, රූ. 1, පර්. 18.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3546 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 294/264 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 3546හි එකී ලොට් 01, බලයලත් මානක තැන ජේ. ටී. ඩේවිඩ් යන අය විසින් සාදන ලද අංක 4150ඒ පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කොට ඇති සර්වසම ඉඩම වන අතර, එය තවත් අයුරකින් බලයලත් මානක තැන ජේ. ටී. ඩේවිඩ් යන අය විසින් සාදන ලද 1954 මැයි මස 03 දාතම හා අංක 4150 දරන පිඹුරේ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සහ නගර සීමාවන් තුළ කටුකැලේ වශයෙන් කලින් විස්තර කොට ඇති හල්ලොලුව පාර පිහිටි "කටුකැලේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ටී. ඩේවිඩ් යන අය විසින් සාදන ලද 1954 මැයි මස 03 දාතම හා අංක 4150 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට, සීමා නිර්ණය කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : හල්ලොලුව පාර සහ බස්නාහිරට : ඩොක්ටර් ජී. සී. මෙන්ඩිස් යන අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ නමයයි හතරෙන් එකක් (අ. 0, රූ. 1, පර්. 19 1/4) විශාල ඉඩම් කොටස සමග වගාවන්, අළුතින් තනන ලද නිවස සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 4150 දරන පිඹුරට අනුවය.

"F" ලක්ෂයේ සිට "G" ලක්ෂය දක්වා පාර සඳහා වෙන් කිරීම වශයෙන් ලකුණු කොට ඇති බලයලත් මානක තැන බී. ඒ. එස්. කෘෂන් යන අය විසින් සාදන ලද 1953 පෙබරවාරි මස 20 දාතම හා අංක 1526 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් නිරූපිත ළිඳ භාවිතා කිරීමේ අයිතිය ද දිගින් අඩි 390කින් සහ පළලින් අඩි 12කින් යුතු මාර්ගය දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සහ බලයලත් මානක තැන ජේ. ටී. ඩේවිඩ් යන අය විසින් සාදන ලද 1956 සැප්තැම්බර් මස 24 දාතම හා අංක 41158 දරන පිඹුරේ තීන්තෙන් වර්ණ ගන්වන ලද මාර්ගයන් සහ "G" ලක්ෂයේ සිට "H" ලක්ෂ්‍යය දක්වා ළඟාවීමේ මාර්ගය සහ බලයලත් මානක තැන බී. එස්. ඒ. කෘෂන් යන අය විසින් සාදන ලද 1953 පෙබරවාරි මස 20 දාතම හා අංක 1526 දරන පිඹුරේ ලොට් X වශයෙන් නිරූපිත ළිඳ භාවිතා කිරීමේ අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-291/2

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී-වැල්ලවාය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කළුආරච්චිලාගේ නීතා දීපිකා කුමාරි සහ අබේසිංහ ආරච්චිගේ ප්‍රියන්ත ලාල් අබේසිංහ.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2006.12.29 දින සහ අංක 14609 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කළුආරච්චිලාගේ නීතා දීපිකා කුමාරි සහ අබේසිංහ ආරච්චිගේ ප්‍රියන්ත ලාල් අබේසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූහත්දහස් තුන්සිය පනස්තුනයි ශත හැටදෙක (රු. 4,97,353.62) ක මුදලක් 2010.05.14 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,97,353.62 ක මුදලට 2010.05.15 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 14609 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළේ, පුබුදුවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පුබුදුවැව ගමේ පිහිටි රජයේ ඉඩමට මායිම් වන, උතුරට : ලියනගේ සෝමදාසට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : ඩබ්. එම්. මද්දුමමැණිකේට සහ ඩබ්. එම්. ඥාණවතීට අයිති ඉඩමෙන් ද, දකුණට : අතුරු පාර සඳහා වෙන් කළ කොටසින් ද, බස්නාහිරට : ඒ. ජේ. එම්. ජිනදාසට අයිති ඉඩමෙන් ද මායිම් වූ අක්කර එක (අ. 1, රූ. 0. පර්. 0) විශාල ඉඩම සමග එහි පිහිටි සියළු දේත් වන මෙය මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් ඩී ඕ/එම්108/248 යටතේ ලියාපදිංචි කර ඇත.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළයේ, පුබුදුවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පුබුදුවැව ගම පිහිටි රජයේ ඉඩමට බලයලත් මානක බී. ජී. සී. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද 1998.08.26 දිනැති අංක 2159 පිඹුරේ ලොට් 1 නමැති කොටසට මායිම් වන උතුරට : පාර සඳහා වෙන් කළ කොටසින් ද සහ වර්ණසීලී වික්‍රමසිංහට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : වර්ණසීලී වික්‍රමසිංහට සහ ආර්. එම්. සුදුබංඩාට අයිති ඉඩමෙන් ද, දකුණට : සෝමදාස ලියනගේ වගාකල ඉඩමෙන් සහ බස්නාහිරට : ඒ. ජේ. එම්. ජිනදාසට අයිති ඉඩමෙන් ද මායිම් වූ අක්කර එක (අ. 1. රූ. 0, පර්. 0)ක් විශාල ඉඩම, ගොඩනැගිලි සමග එහි පිහිටි සියළුදේත් වන මෙය මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් ඩී ඕ/එම්21/99 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-283/15

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ප්‍රභාත් නිලන්ත විමලරත්න සහ රූපිකා විජිතා විජේසිංහ.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අදිකාරි විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද පිළිවෙලින් 2008.01.09 දින අංක 163 සහ 2009.09.11 දින අංක 542 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රභාත් නිලන්ත විමලරත්න සහ රූපිකා විජිතා විජේසිංහ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එකොලොස් ලක්ෂ තිස්නවදහස් එකසිය අසූදෙකයි ශත හැටපහ (රු. 11,39,182.65) ක මුදලක් 2009.12.18 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 11,39,182.65 ක මුදලට 2009.12.19 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 163 සහ 542 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ මඩපාතහි පිහිටි ශයිලාතලරාම පන්සල පාරේ, වරිපනම් අංක 041/4 දරන "මොරගහවත්ත" (කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක එච්. ලාල් ගුණසේකර විසින් මැන සාදන

ලද 2002.04.09 දිනැති අංක 8661 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 1ඒ2 න් ද, නැගෙනහිරට : අංක 4526 දරන පිඹුරේ ලොට් 1බී වලින් ද, දකුණට : දෝන් පෝල් ආටිගලට අයත් මොරගහවත්තෙන් ද සහ බස්නාහිරට : කජුගහකොටුවෙන් සහ ශයිලාතලරාමට අයත් මිල්ලගහවත්තෙන් ද මායිම් වූ එකී අංක 8661 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12)ක විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමග වන මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2750/31 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද 1993.01.05 දිනැති අංක 4526 දරන පිඹුරේ ලොට් 6 (අඩි 10ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද හැරවීමේ මාර්ගය) සහ ලොට් 1බී (අඩි 2 1/2 ක් පළල පාර) මාර්ග මතින් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-283/14

---

## හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

යාපා බණ්ඩාර මුදියන්සේලාගේ ජයන්ත සේන යාපා බණ්ඩාර සහ වැලිපිටියේ මුදියන්සේලාගේ මංගලිකා කුමාරි.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2008.02.12 දිනැති සහ අංක 3101 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යාපා බණ්ඩාර මුදියන්සේලාගේ ජයන්ත සේන යාපා බණ්ඩාර සහ වැලිපිටියේ මුදියන්සේලාගේ මංගලිකා කුමාරි යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටදෙලක්ෂ විසිපන්දහස් පන්සිය හැටයි ශත හැටඑක (රු. 62,25,560.61) ක මුදලක් 2010.04.30 වන දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 62,25,560.61 ක මුදලට 2010.05.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3101 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ, කලල්ගොඩ, මිල්ලගහවත්ත "කලල්ගොඩලන්ද" සහ "කැකුණගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. කපුගීකියනගේ විසින් පිළියෙල දරන ලද 1984.03.30 දිනැති අංක 1769 දරන පිඹුරේ බෙදා වෙන් කළ ලොට් 3 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කලල්ගොඩ සිට හෝකන්දරට ඇති පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 4න් ද, දකුණට : ලොට් 5 වලින් ද, සහ බටහිරට : ලොට් 2 වලින් ද මායිම් වූ එකී අංක 1769 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිඑක (අ. 0, රූ. 0, පර්. 21) ක් විශාල ඉඩම ගොඩනැගිලි ගහකොළ, සහ සියළුදේත් සමග වේ.

මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 603/273 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-283/13

---

## හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හෙට්ටිගේ චමින්ද පෙරේරා.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2005.09.07 සහ 2006.08.22 දිනැති සහ පිළිවෙලින් අංක 2214 සහ 2491 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හෙට්ටිගේ චමින්ද පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ හැත්තෑහත්දහස් නවසිය තිස්හයයි ශත තිස් පහ (රු. 6,77,936.35) ක මුදලක් 2010.04.30 වන දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,77,936.35 ක මුදලට 2010.05.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම්

සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2214 සහ 2491 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ, ඇරැව්වල දියපොරගහදෙනිය නමැති ඉඩමට බලයලත් මානක එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් පිළියෙල කරන ලද 1996.10.10 දිනැති අංක 1864 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 2 නැමති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1න් ද, නැගෙනහිරට : විජේමාන්නට අයිති කුඹුරෙන් ද, දකුණට : පාරෙන් ද සහ බටහිරට : අඩි 20ක් පළල පාරෙන් ද මායිම් වූ එකී අංක 1864 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයයි දශම හතරයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 10.40) ක් විශාල ඉඩම ගොඩනැගිලි, ගහකොළ සහ සියළු දේත් සමග වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2190/188 යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මානක ඩී. කපුගීකියනගේ විසින් නැවත මැන සාදන ලද 2004.04.28 දිනැති අංක 5927 දරන පිඹුර ප්‍රකාර පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ, ඇරැව්වල දියපොරගහදෙනිය නමැති ඉඩමේ ලොට් ඒ නමැති ඉඩම් කොටසට මායිම්, ඊසානදිගට : විජේමාන්නට අයිති කුඹුරෙන් ද, ගිණිකොණට : පාරෙන් ද, නිරිතදිගට : පාරෙන් ද සහ වයඹට : ලොට් 1න් ද මායිම් වූ එකී අංක 1864 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයයි දශම හතරයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 10.40)ක් විශාල ඉඩම ගොඩනැගිලි, ගහකොළ සහ සියළුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-283/12

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මීගමුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වෙට්පැට්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2010.04.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට නවයක (9%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද (මෙම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) සහ රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක් (රු. 150,00,000) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලි අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ
(ආ) රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොලි අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී, බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද (මෙම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් පන්කෝටි හැත්තෑපන් ලක්ෂ පනස් නවදහස් දෙසිය තුනකුත් ශත හැට පහක (රු. 5,75,59,203.65) මුදල සහ 2009 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අසූඑක් ලක්ෂ හැත්තෑතුන් දහස් විසි තුනකුත් ශත හැත්තෑ හයක් (රු. 81,73,023.76) සඳහා වර්ෂයකට සියයට පහළොවකුත් දශම පහ (15.5%) බැගින් පොළිය ද, රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් අටසිය අසූ හතක් (රු. 21,64,887) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට හයක් (6%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද, රුපියල් තිස්හතර ලක්ෂ අනූ දෙදහස් නවසිය අනූ දෙකකුත් ශත අසූ හයක් (රු. 34,92,992.86) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දින වලදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් වන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් එක්කෝටි විසිලක්ෂයක් (රු. 1,20,00,000) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින්, එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ
(ආ) රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී, බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහක් (10.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද (මෙම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) රුපියල් පනස් හතර ලක්ෂයක් (රු. 54,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් අප්‍රේල් 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන, බරතැබූ මධ්‍යක තැන්පතු පොළී අනුපාතිකය (ඒ. ඩබ්ලිව්. ඩී. ආර්) වර්ෂයකට සියයට එකොළහකුත් දශම පහක් (11.5%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ
(ආ) රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී, බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට නවයක (9%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද (මෙම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) සහ රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක් (රු. 1,50,00,000) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලි අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, හෝ
(ආ) රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී, බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද (මෙම පොලී අනුපාතිකය එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් සහ මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය සහ වත්කම් විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 55, 56, 1329, 1432, 363, 362, 406 හා 407 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම් හා පරිශ්‍ර සහ වත්කම් කොළඹ බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මතර කරයි.

**අංක 55, 1329, 1432, 406 සහ 407 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

01. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පහල බුලත්ගම කිතුල්ගල පළාත, ගෝනගමුව සහ තැලිගම යන ගම්වල පිහිටි "බිබිලිඔයතැන්න

එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් විසින් මැන සකස් කළ අංක 231-2කේ හා 2001 පෙබරවාරි මස 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : අංක 231-2කේ දරන පිඹුරේ ලොට් අංක 2 සහ 10 ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් අංක 3 සහ ලොට් අංක 11 දරන බිම් කට්ටි (වතු පාර) ද, දකුණට : (එච්) පාර, කරවනැල්ල සිට කිතුල්ගලට යන මහ පාර ද, බස්නාහිරට : අයි. එච්. හෙන්ද්‍රික්සිංහට සහ තවත් අයට අයිති ජයතුකන්ද, එම්. ආරියදාසට අයිති බඹරගල වත්ත ජයතුකන්ද සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන, 204-2කේ පිඹුරේ දැක්වෙන "බිබිලිඔයතැන්න එස්ටේට්" වත්ත ද යන මායිම් ඇතුළත අක්කර විසිතුනකුත් රූඩ් දෙකකුත් පර්චස් හතයි දශම තුනක් (අ. 23, රූ. 2, පර්. 7.3) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හෝ එයට අනුබද්ධ සියලු දේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඉහත සඳහන් අංක 231-2කේ දරන පිඹුරට අනුව මෙම ඉඩමේ මායිම් වඩාත් නිවැරදිව පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ :

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පහල බුලත්ගම කිතුල්ගල පළාත, ගෝනගමුව සහ තැලිගම යන ගම්වල පිහිටි "බිබිලිඔයතැන්න එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් විසින් මැන සකස් කළ අංක 231-2කේ හා 2001 පෙබරවාරි මස 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : අංක 231-2කේ දරන පිඹුරේ ලොට් අංක 2 සහ 11 ද, නැගෙනහිරට : එම පිඹුරේ දැක්වෙන වතු පාර ද, දකුණට : (මහා මාර්ග) පාර ද, බස්නාහිරට : අයි. ජී. හෙන්ද්‍රික්සිංඤෝට සහ තවත් අයට අයිති ජයතුකන්ද ද, යන මායිම් ඇතුළත අක්කර විසිතුනකුත් රූඩ් දෙකකුත් පර්චස් හතයි දශම තුනක (අ. 23, රූ. 2, පර්. 7.3) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හෝ එයට අනුබද්ධ සියලු දේ. මෙම ඉඩම අවිස්සාවෙල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

02. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පහල බුලත්ගම කිතුල්ගල පළාත, ගෝනගමුව සහ තැලිගම යන ගම්වල පිහිටි "බිබිලිඔයතැන්න එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් විසින් මැන සකස් කළ අංක 527-2කේ හා 2002 මැයි මස 12 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5ඒ ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : කේ. එල්. පේදුරු අප්පුහාමිට සහ තවත් අයට අයිති බෝමලුවවත්ත සහ පීපීකේජී644 පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : පීපීකේජී644 පිඹුරේ ලොට් අංක 1, අංක 1255 පිඹුරේ දැක්වෙන ලෙනවලගාවත්ත සහ (එච්) පාර ද, දකුණට : පාර, ලොට් අංක 5බී සහ කේ. එල්. යෝතන්සිංඤෝට සහ තවත් අයට අයිති පල්ලේවත්ත ද, බස්නාහිරට : ලොට් අංක 5බී, කේ. එල්. යෝතන්සිංඤෝට සහ තවත් අයට අයිති පල්ලෙවත්ත සහ අංක 231-2කේ දරන පිඹුරේ ලොට් අංක 4 ද යන මායිම් ඇතුළත අක්කර විසිතුනක (අ. 23, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම. මෙම ඉඩම අවිස්සාවෙල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ටී46/197 යටතේ ලියාපදිංචි කර තිබේ.

මෙයට පහත විස්තර කරන බිම් කට්ටිය මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් ය :

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පහල බුලත්ගම කිතුල්ගල පළාත, ගෝනගමුව සහ තැලිගම යන ගම්වල පිහිටි "බිබිලිඔයතැන්න එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් විසින් මැන සකස් කළ අංක 231-2කේ හා 2001 පෙබරවාරි මස 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 11 (වතුපාර) ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : එම පිඹුරේ ලොට් අංක 3, 4 සහ 9 සහ පිළිමලෙන පුරාණ විහාරය ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් අංක 4 සහ (එච්) පාර ද, දකුණට : එම පිඹුරේ ලොට් අංක 1 සහ 3 ද, බස්නාහිරට : ලොට් අංක 9, 1 සහ 3 ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් දෙකකුත් පර්චස් විසිපහයි දශම තුනක් (අ. 1, රූ. 2, පර්. 25.3) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

*විස්තරය*

98" ට්‍රෆ් යුනිට්
48" ට්‍රෆ් ෆෑන්ස්
වෝටා සිෆ්ටර්
මිච් සිෆ්ටර්
ෆයිබර් මැට්
මිඩ්ල්ටන් ස්ටෝක් එක්ස්ට්‍රැක්ටර්
47" රෝලර්
අඩි 6-2 ස්ටේජ් ඩ්‍රයර්
ටැරි නිපර්
චයිනා කටර්
සෙන්වෙක් කලර් සෙපරේටර්
විදරිං ට්‍රෆ් (දිග 100'x6'x4') අ. බ. 9/48" ට්‍රෆ් ෆෑන් සහිත
ටී රෝලර් (අ. බ. 15/47" ප්‍රමාණය)
හියුමිඩිෆයර් (අ. බ. 1.5/18" ප්‍රමාණය)
ඩ්‍රයර්ස්
3T ස්ටෝක් එක්ස්ට්‍රැක්ටර් (සුපර් 3T - 11000A)
ෆයිබර් මැට්ස් (අ. බ. 5/6'x3')
මිඩ්ල්ටන් සිෆ්ටර් (අ. බ. 2/3'x6')
මිච් සිෆ්ටර් (අ. බ. 5/3'x6')
සක්ෂන් විනෝවර් (අ. බ. 8/38'x3')
කලර් සෙපරේටර්ස්
ටැරි නිපර් (අ. බ. 2/750rpm)
පැකර් (අ. බ. 2)
18" මකිටා චේන් සෝ
250kw සවුන්ඩ් ප්‍රෑෆ් ජෙනරේටරය
සෙන්වෙක් සුපර් FTR සීරිස් කලර් සෙපරේටර්
ටී ක්ලීනිං මැෂින් - මොඩල් FTR 102W
ඕවර්හෙඩ් රේලිං සිස්ටම්, මුළු දිග මීටර් 247-ඔවර්හෙඩ් ට්‍රොලි 10ක් සහිතය
අඩි 20 වයිබ්‍රේටිං කන්වේයර්
8'x36' කන්වේයර් - රෝල් බ්‍රේකර් දක්වා
9'x36' කන්වේයර් - රෝල් බ්‍රේකර් දක්වා
19'x18' කන්වේයර් - රෝල් බ්‍රේකරයේ සිට රෝලර් දක්වා
රිවර්සිබල් කන්වේයර්ස්
ෆයිබර් හෝපර් සහ මල නොබැඳෙන වානේ රාමු සහිත අලුතින් වැඩිදියුණු කළ රෝල් බ්‍රේකර්ස් වැඩිදියුණු කළ රෝල් ජැකට්ස්
ඩ්‍රයර් සඳහා වයිබ්‍රේටිං කන්වේයර්
ඩ්‍රයර් සඳහා රිවර්සිබල් කන්වේයර්
22" කන්වේයර් ෆෝ ඩ්‍රයර් ෆීඩිං
21" කන්වේයර් ෆෝ ඩ්‍රයර් ෆීඩිං

**අංක 56 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද යන්ත්‍රෝපකරණ**

පහත දැක්වෙන චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුළුව සියළු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ :

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ජ්ලෙනම් චේම්බර් විදරිං ට්‍රෆ් | 05 |
| එයරොෆොයිල් ෆෑන් | 05 |
| ග්‍රීන් ලීෆ් සිෆ්ටර් | 01 |
| 47" රෝලර් | 01 |
| 45" රෝලර් | 03 |
| 40" රෝලර් | 01 |

| | |
|---|---|
| 4"-6" රිසිප්‍රොකේටිං ටයිප් රෝල් බ්‍රේකර් | 03 |
| ඩිරෙක්ෂනල් හියුමිඩිෆයර් | 03 |
| 6' ස්ටේජ් 3 ඩ්‍රයර් | 01 |
| 30" රෝද කියත් | 01 |
| රෝටරි සිෆ්ටර් විත් කන්වේයර් | 01 |
| මිඩ්ල්ටන් ස්ටෝක් එක්ස්ට්‍රැක්ටර් - විත් ජම්බෝ පිකර් ඇන්ඩ් කන්වේයර් | 01 |
| මිච් සිෆ්ටර් | 03 |
| 3T ඉලෙක්ට්‍රික් ස්ටෝක් එක්ස්ට්‍රැක්ටර් | 01 |
| ඩස්ට් ෆෑන් | 04 |
| ෆයිබ්‍රොමැට් විත් කන්වේයර් | 01 |
| ඩබල් ටී පැකර් විත් කන්වේයර් | 01 |
| සක්ෂන් විනෝවර් | 01 |
| පැකෝ කටර් | 01 |

විදුලි යන්ත්‍රෝපකරණ

KVA220 ජෙනරේටරය සහ අමතර කොටස් උපාංග හා මෙවලම්

**අංක 362 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද වත්කම් විස්තරය**

පහත සඳහන් යන්ත්‍රය ඇතුළුව සියලු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ :-

| *විස්තරය* | *සංඛ්‍යාව* |
|---|---|
| කොම්ප්‍රෙසු එක්ස්කැවේටරය | 01 |

සහ බත්තරමුල්ල දකුණු තලංගම ඉසුරු උයන, අංක 549බී දරන පරිශ්‍රයේ සහ වෙනත් යම් ගුදම්, ගබඩා සහ පරිශ්‍ර මත සහ තුළ තිබෙන සියලු අමතර කොටස්, උපාංග සහ මෙවලම්

**අංක 363 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද මෝටර් වාහන විස්තරය**

| *හඳුනා ගැනීමේ අංකය* | *විස්තරය, වර්ගය මෝස්තරය අශ්ව බලය යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නතර කර තබන ස්ථානය* |
|---|---|---|---|---|
| WPLF 7134 | ටාටා මෝටර් ලොරිය | MAT38652 688R14899 | 497TC3E RZ827186 | සියල්ලම, අංක 549බී, |
| WPLF 7130 | ටාටා මෝටර් ලොරිය | MAT38652 688R15011 | 497TC93E RZ827191 | ඉසුරු උයන, දකුණු |
| WPLF 7133 | ටාටා මෝටර් ලොරිය | MAT38652 688R14898 | 497TC93E RZ827187 | තලංගම, බත්තරමුල්ල. |

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව.
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

07-216

**සම්පත් බැංකුව පී. එල්. සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එස්. විජයසේකර *විවාහයට පෙර* සහබන්දු සහ එම්. වී. ජයසිංහ.
ගිණුම් අංක : 0001 5014 8170.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2007 මැයි මස 30 දාතම හා අංක 3719 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රියානි විජයසේකර *විවාහයට පෙර* සහබන්දු සහ මෙරිල් වර්නන් ජයසිංහ යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී ශ්‍රියානි විජයසේකර *විවාහයට පෙර* සහබන්දු උසක්කරු වශයෙන් ද පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ හැත්තෑ දහස් හයසිය තිස් හයයි ශත විසි හතරක (රු. 7,70,636.24) මුදලක් 2010 පෙබරවාරි මස 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හත්ලක්ෂ හැත්තෑ දහස් හයසිය තිස් හයයි ශත විසි හතරක (රු. 7,70,636.24) මුදල ද, 2010 පෙබරවාරි 11 දින සිට අංක 3719 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂයක (රු.7,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3719 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ අත්තිඩියේ පිහිටි ප්‍රධාන පාර වරිපනම් අංක 216/1 දරන "කෝන්ගමුවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඒ. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1996 නොවැම්බර් මස 26 දාතම හා අංක 933 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 3 සහ මිනුම් පිඹුරු අංක 928හි ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති පාර සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : මිනුම් පිඹුරු අංක 928හි ලොට් 8, දකුණට : කොච්ලෝන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඉඩම සහ බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවයි හයක් (අ. 0, රූ. 0, පර්. 6.06) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග

අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 933 දරන පිඹුර අනුව වෙළුම/පත්ඉරුව එම් 2032/218 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අංක 928 හා 1994 ජූලි 17 දාතම දරන පිඹුරේ ලොට් 4

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-291/18

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එස්. එම්. එස්. සමරකෝන්
ගිණුම් අංක : 1046 5006 3171.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් යන අය විසින් ලියා සහතික කරන ලද 2004 සැප්තැම්බර් මස 17 දාතම හා අංක 12690 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමරකෝන් මුදියන්සේලාගේ සුගත් සමරකෝන් යන අය බන්ධනදායී වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහසය ලක්ෂ හැටඑක් දහස් හයසිය හැත්තෑ අටයි ශත හැට එකක (රු. 16,61,678.61) මුදලක් 2010 ජනවාරි මස 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහසය ලක්ෂ හැටඑක් දහස් හයසිය හැත්තෑ අටයි ශත හැට එකක (රු. 16,61,678.61) මුදල ද, 2010 ජනවාරි 07 දින සිට අංක 12690 දරන එකී බැඳුකරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පහළොස් ලක්ෂ පනස් හත් දහස් එකසිය හැට එකයි ශත හැට නමයක (රු. 15,57,161.69) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ඒවා) අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 12690 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකිඳ කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ, දෙමෝදර පිහිටි "ඇල්ලන්ද" යයි කියනු ලබන ඉඩමෙන් දකුණු දෙසට රූඩ් එකක් විශාල නොබෙදූ ඉඩම් කොටසට මායිම්, උතුරට : පතන ඉඩම ද, නැගෙනහිරට : රත්නපුර දක්වා දිවෙන පාර, දකුණට : කඳුර සහ බස්නාහිරට : කඳුපෙළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් එකොළහක් (අ. 0, රූ. 3, පර්. 11) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග ය.

බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1990.07.29 දාතම හා අංක 141 දරන පිඹුරේ දැක්වීමකට අනුව විස්තර කොට ඇති එම ඉඩමේම සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ඉඩම් කොටස වශයෙන් දැන් දරන හා අයත්ව ඇති එකී ඉඩම පහතින් විස්තර කොට ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ, දෙමෝදර පිහිටි "ඇල්ලන්ද" වශයෙන් හඳුන්වනු ලබන හා කියනු ලබන අංක 141 දරන එකී පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් අංක 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කඳුර, නැගෙනහිරට : බෙරගල සිට හාලි ඇල දක්වා ප්‍රධාන පාර ද, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව J51/279 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-291/15

---

**සම්පත් බැංකුව පී. එල්. සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඒ. කේ. ඩී. ජේ. සී. පෙරේරා සහ එම්. ඩී. එල්. ප්‍රේමරත්න.
ගිණුම් අංකය : 0001 5018 2255.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2004 ජුනි මස 16 දාතම හා අංක 1621 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අලවතු කංකානමලාගේ දොන් ජයාන් චන්දික පෙරේරා සහ මුතුමුණි දේශා ලක්මිණි ප්‍රේමරත්න යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී අලවතු කංකානමලාගේ දොන් ජයාන් චන්දික පෙරේරා උකස්කරු වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන්ලක්ෂ පනස් එක් දහස් හයසිය විසි අටයි ශත දහ නමයක (රු. 3,51,628.19) මුදලක් 2010 ජනවාරි මස 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්ලක්ෂ පනස් එක් දහස් හයසිය විසි අටයි ශත දහ නමයක (රු. 3,51,628.19) මුදල ද, 2010 ජනවාරි 07 දින සිට අංක 1621 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන්ලක්ෂ විසිනමදහස් හත්සිය පනස් පහයි ශත දහතුනක (රු. 3,29,755.13) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහක් (9.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත් ඒවා) අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1621 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බැලුම්මහර පිහිටි ගොඩගෙදර 1 වැනි පටුමගේ වරිපනම් අංක 82/4 දරන "මාරගහලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. සමරවික්‍රම යන අය විසින් සාදන ලද 1996 ජුනි මස 16 දාතම හා අංක 188/1996 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 970ඒ දරන පිඹුරේ ලොට් X අඩි 20ක් පළල පාර (නිවාස වල සිට ප්‍රධාන පාර දක්වා), නැගෙනහිරට : ලොට් B, දකුණට : අංක 1230 දරන පිඹුරේ ලොට් 12 සහ බස්නාහිරට : අංක 376 දරන පිඹුරේ ලොට් 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 188/1996 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ492/158 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ආර්. එම්. ජේ. රණසිංහ යන අය විසින් සාදන ලද 1994 ඔක්තෝබර් මස 21 දාතම හා අංක 970ඒ දරන පිඹුරේ ලොට් X වශයෙන් ලකුණුකොට ඇති පාර සඳහා වෙන් කිරීම (අඩි 20 පළල) මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-291/17

### මහජන බැංකුව - ජාඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2008.05.08 දිනැති අංක 13382 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ක්‍රිස්ටීන් ලුසියා වෙල්ලයියා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හාරසිය විසිදෙකක (රු. 27,13,422) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.05.16 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හාරසිය විසිදෙක (රු. 27,13,422) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිහත් ලක්ෂ දහතුන්දහස් හාරසිය විසි දෙක (රු. 27,13,422) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 13382 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, ඒකල ග්‍රාමයේ පිහිටි ගාල්ලවත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් 2006.10.21 සකස් කරන ලද අංක 4173 දරන පිඹුරට අනුව ලොට් අංක 11 දරන කොටසට මායිම්, උතුරට : ලොට් 10, නැගෙනහිරට : පිඹුරු අංක පී. පී. 3081හි ලොට් අංක 01, දකුණට : පිඹුරු අංක 4173හි ලොට් අංක 12 (අඩි 20ක් පළල පාර) බස්නාහිරට : පිඹුරු අංක 4173 හි ලොට් අංක 47 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී217/102 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස් හි මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර.

07-329

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොටහේන ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : රැම්කෝ සී ඇන්ඩ් එෆ් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

එනම්, රැම්කෝ සී ඇන්ඩ් එෆ් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් (බන්ධනදායීගේ අධ්‍යක්ෂවරයකු වන) පපමාල් සිවලිංගම් උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පීකිව් 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. ද ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 265 සහ 2006.12.15 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 265 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2010.02.16 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස්තුන්ලක්ෂ හතලිස් එක් දහස් දෙසිය පහළොවයි ශත දහඅට (රු. 33,41,215.18) ක මුදල සහ 2010.02.05 වැනි දින සිට රුපියල් දහනව ලක්ෂ හතලිස් හතර දහස් හාරසිය හැටහතර (රු. 19,44,464) ක මුදල මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොළිය ද, 2010.02.17 වැනි දින සිට රුපියල් දහතුන් ලක්ෂ විසිදහස් නමසිය හැටනවයයි ශත අනූතුන (රු. 13,20,969.93) ක මුදල මත වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් :

එකී අංක 265 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් තිස් තුන්ලක්ෂ හතලිස් එක්දහස් දෙසිය පහළොවයි ශත දහ අට (රු. 33,41,215.18) ක මුදල සහ ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

#### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 8, බටහිර කොටහේන අලුත්මාවත පාරේ සහ විද්‍යාල පාර ඔබ්බේ 16 වැනි පටුමගෙහි පිහිටි වරිපනම් අංක 99 දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 4801 සහ 1994.02.21 දිනැති සහාධිපත්‍ය සැලැස්ම අනුව බිම් මහලේ ඒකක අංක ජීබී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඊසානදිගට : 16 වැනි පටුමගේ වරිපනම් අංක 101 සහ එම ඒකකයේ බිත්තිය, ගිණිකොණට : මෙම ඒකකය සහ සීඊ4 හි විවෘත පෙදෙස අතර බිත්තිය, නිරිතදිගට : මෙම ඒකකය සහ සීඊ21 අතර බිත්තිය, වයඹට : මෙම ඒකකය සහ සීඊ3 විවෘත පෙදෙස අතර බිත්තිය, පතුළ : එල්. ජී. බී. ඒකකයට ඉහළින් පිහිටි මෙම ඒකකයේ කොන්ක්‍රීට් පොලවෙහි මධ්‍යය, මුදුන : ඉහළ එෆ්. බී. ඒකකයෙහි කොන්ක්‍රීට් පොළොවෙහි මධ්‍යය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් වර්ග මීටර් අසූ හතරයි දශම අට (වර්ග මීටර 84.8) එනම් වර්ග අඩි 913ක් විශාල සහාධිපත්‍ය නිවාස ඒකකය.

ජීබී ඒකකය, සාලය, කෑම කාමරය, ප්‍රධාන නිදන කාමරය, නිදන කාමර 2ක්, කුස්සිය, වැසිකිළි 2ක් සහ ජල ගබඩාව සහ බැල්කනියෙන් සමන්විත වන්නේ ය.

සහාධිපත්‍ය දේපළෙහි පොදු පරවශතාවය සම්බන්ධයෙන් ජීබී ඒකකයේ නොබෙදූ කොටස් හිමිකම 2.21%ක් වන්නේ ය.

ජීබී ඒකකයේ ආසන්නතම පොදු ප්‍රවේශය සීඊ 21 වන්නේ ය.

ව්‍යස්ථාපිත පොදු පරවශතාවයන් සමඟින් කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහාධිපත්‍ය/ඒ46/133හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සුදත් නැලිගම,
සහකාර කළමනාකර - ණය අයකර ගැනීම්.

07-336

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1117002535.
ණය ගිණුම් අංක : 338548 සහ 368930.
සේනාධීරගේ දොන් රෝහිත ජගත්,
සේන ටිම්බර් සේල්ස් සෙන්ට(ර්) හි අයිතිකරු.

2010 පෙබරවාරි මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. අයි. ජයසූරිය විසින් 2007 ජූනි මස 07 වැනි දින සහතික කරන ලද අංක 341 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සේන ටිම්බර් සේල්ස් සෙන්ටර් හි අයිතිකරු සේනාධීරගේ දොන් රෝහිත ජගත් ණයකරු හැටියට ද පැහැර හැර ඇති (මෙහි 2 වැනි උපලේඛනයෙහි සවිස්තර විස්තර කර ඇති ඉඩම) හෙයින් ද,

සහ

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවර්ධන විසින් 2006 දෙසැම්බර් මස 28 වැනි දින සහතික කරන ලද අංක 3092 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ ද, බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සේන ටිම්බර් සේල්ස්

සෙන්ට(ර්) හි අයිතිකරු සේනාධීරගේ දොන් රෝහිත ජගත් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති මෙහි 2 වැනි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති ඉඩම) හෙයින් ද,

දැන් එකී බැඳුම්කරය යටතේ රුපියල් සය මිලියන අටසිය හතලිස් දහස් නවසිය විසිතුනයි ශත හතලිස් පහක (රු. 68,40,923.45) මුදලක් 2009 ඔක්තෝබර් මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් සය මිලියන අටසිය හතලිස් දහස් නවසිය විසිතුනයි ශත හතලිස් පහක (රු. 68,40,923.45) මුදල අයකර ගැනීම සඳහා 2009 ඔක්තෝබර් මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 53,72,509.46 ක මුදල මත 22% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවා ද මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 341 සහ 3092 දරන බැඳුම්කර යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි 1 වැනි සහ 2 වැනි උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත යොමු කරන ලද පළමුවැනි උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු වික්ටර් චන්ද්‍රදාස විසින් 1998 අගෝස්තු මස 19 වැනි දින සාදන ලද පිඹුරු අංක 61/98හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ උඩහමුල්ලේ දුම්රිය ස්ථානයට යන පාරේ වරිපනම් අංක 251/1 දරන අට්ටික්කාගහවත්තේ ගසකොළ, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කළ ලොට් B1/2 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම් සී. පෙරේරා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ඩී. ඩී. වයි. අබේවර්ධන හිමිකම් කියන ඉඩම ද , දකුණට : උඩහමුල්ලේ දුම්රිය ස්ථානයට යන පාර ද සහ බස්නාහිරට : ලොට් B1/4 (වඩාත් නිවැරදිව ලොට් B1/1) ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 61/98ට අදාළ පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ M2347/07 වෙළුම පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

### ඉහත යොමු කරන ලද දෙවැනි උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු ක්ලෙමන්ට් එස්. පී. ප්‍රනාන්දු විසින් 1982 අගෝස්තු මස 26 වැනි දින සාදන ලද පිඹුරු අංක 1673හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ උඩහමුල්ලේ දියකඩහේන පාරේ වරිපනම් අංක 47 දරන ගොරකගහවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ලොට් 2B ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් 2A ද, නැගෙනහිරට : බී. ඒ. ජයසේන හිමිකම් කියන ඉඩම ද, දකුණට : හ(ර්)මන් පෙරේරා හිමිකම් කියන ඉඩම ද සහ බස්නාහිරට : එකී දියකඩහේන පාර ද යන මායිම් තුළ පිඹුරු අංක 1673ට අනුව පර්චස් දහසයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල ඉඩම නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1353/298 වෙළුම පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

නැවත මැන ඇති ලොට් 2B මෙලෙස විස්තර කර ඇත :-

අනුග්‍රහලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් 2006 අප්‍රේල් මස 29 වැනි දින සාදන ලද පිඹුරු අංක 5293හි දැක්වෙන එකී උඩහමුල්ලේ දියකඩහේන පාරේ, වරිපනම් අංක 47 දරන ගොරකගහවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ලොට් 2B ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් A ද, නැගෙනහිරට : බී. ඒ. ජයසේන හිමිකම් කියන ඉඩම ද, දකුණට : හ(ර්)මන් පෙරේරා හිමිකම් කියන ඉඩම ද, සහ බස්නාහිරට : එකී දියකඩහේන පාර ද යන මායිම් තුළ පිඹුරු අංක 5293ට අනුව ගහකොළ, වගාවන්, සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් එක්ව පර්චස් දහසයක් (අ. 0, රූ. 0, පර්. 16) විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

07-273

---

### මහජන බැංකුව - බුත්තල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න මහතා විසින් සහතික කරන ලද 2005.04.07 දිනැති අංක 6386 සහ 2006.07.05 දිනැති අංක 7073 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අධිකාරී මුදියන්සේලාගේ ජයතිලක සහ වීරසිංහ මුදියන්සේලාගේ ලීලාවතී යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී අංක 6386 දරන උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්හතරදහස් පන්සිය හැත්තෑ තුනයි ශත හතර (රු. 1,54,573.04)ක් සහ අංක 7073 දරන උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැටනවදහස් තුන්සිය අසූවයි ශත පනස්තුන (රු. 2,69,380.53) ක් මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, එකී රුපියල් එක්ලක්ෂ පනස්හතරදහස් පන්සිය හැත්තෑතුනයි ශත හතර (රු. 1,54,573.04)ක් සඳහා 2008.11.07 දින සිට සියයට පහළොවයි දශම හතයි පහ (15.75%) බැගින් පොලිය ද, සහ රුපියල් දෙලක්ෂ හැටනවදහස් තුන්සිය අසූවයි ශත පනස්තුන (රු. 2,69,380.53)ක් සඳහා 2009.03.07 දින සිට සියයට දහසයයි දශම හතයි පහ (16.75%) බැගින් පොලිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද, වෙන්දේසි ගාස්තු ද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවා ද අඩු කරගෙන අදාළ මුදල් අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකාර වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 6386 සහ 7073 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල කෝරළයේ දැනට බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගල්ටැම්මණ්ඩිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගල්ටැම්මණ්ඩිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර දෙක (අ. 2, රූ. 0, පර්. 0) ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම උතුරට : සුදුවතුර ආර මාර්ග රක්ෂිතය ද, නැගෙනහිරට : ඩබ්. එම්. පුංචිරාළගේ ඉඩම ද, දකුණට : එච් එම්. ප්‍රේමරත්නගේ ඉඩම ද සහ බස්නාහිරට : ඒ. එම්. උක්කු බණ්ඩාගේ ඉඩම ද මායිම් වූ රජයේ ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් වේ.

ඉහත ඉඩම වැලිමඩ බලයලත් මිනින්දෝරු පී. ඩබ්. නන්දසේන මහතා විසින් 2002.07.29 දිනැති මැන සාදන ලද අංක 3807 දරන පිඹුරුපතේ ද පෙන්නුම් කෙරෙන අතර ''ලොට් ඒ '' වශයෙන් සලකුණු කරනු ලැබ පහත පරිදි විස්තර කෙරේ :-

ඉහත කී මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්ටැම්මණ්ඩිය ගම පිහිටි ''ගල්ටැම්මණ්ඩිය'' නමැති, උතුරට : සුදුවතුර ආර මාර්ග රක්ෂිතය ද, නැගෙනහිරට : ඩබ්. එම්. පුංචිරාල භුක්ති විඳින ඉඩම ද, දකුණට : එච්. එම්. ප්‍රේමරත්න භුක්ති විඳින ඉඩම ද, බස්නාහිරට : ඒ. එම්. උක්කුබණ්ඩා භුක්ති විඳින ඉඩම ද, මායිම් වූ අක්කර දෙක (අ. 2, රූ. 0, පර්. 0) ක් නොහොත් හෙක්ටයාර් බින්දුවයි දශම අටයි බින්දුවයි අට (හෙක් 0.808) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් වේ.

ඉහත ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/M 91/166 දරන පත්‍රිුරුවේ ලියාපදිංචි ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
මහජන බැංකුව.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

07-327

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 422293.
සමරසිංහ මුදියන්සේලාගේ අනිල් හරින්ද්‍ර කමල් සමරසිංහ.

2009 නොවැම්බර් මස 27 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2008 ජනවාරි මස 25 වැනි දින සහතික කරන ලද අංක 1264 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමරසිංහ මුදියන්සේලාගේ අනිල් හරින්ද්‍ර කමල් සමරසිංහ බන්ධනදායී හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නව මිලියන තුන්සිය විසිපන්දහස් තුන්සිය අසූ අටයි ශත හැත්තෑහතක (රු. 93,25,388.77) මුදලක් 2009 නොවැම්බර් මස 05 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් නව මිලියන තුන්සිය විසිපන්දහස් තුන්සිය අසූ අටයි ශත හැත්තෑහතක (රු. 93,25,388.77) මුදල අයකර ගැනීම සඳහා 2009 නොවැම්බර් මස 06 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 80,00,000 ක මුදල මත 21% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවා ද මෙතෙක් ලබාගෙන ඇති යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 1264 දරන බැඳුම්කරය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත යොමු කරන ලද උපලේඛනය

බලයලත් මිනින්දෝරු එච්. එච්. සුහසිංහ විසින් 2004 මැයි මස 28 වැනි දින සාදන ලද අංක 2142 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ පිටකෝට්ටේ පිහිටි ''ගොරකගහ කුඹුර'' සහ ''දෙනිය කුඹුර'' කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන්කර ලොට් 1 ලෙස ලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : නාගරික සංවර්ධන අධිකාරියට අයත් දේපළ ද, නැගෙනහිරට : මෙහි ලොට් 2 ද, දකුණට : මෙහි ලොට් 5 (මාර්ග වෙන්කරය), ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් 1996 අගෝස්තු මස 27 වැනි දින සාදන ලද පිඹුරුපත් අංක 156හි ලොට් B1, B2, B3 සහ B4 ද යන මායිම් තුළ එකී අංක 2142 දරන පිඹුර පරිදි පර්චස් හයයි දශම නමයයි පහක් (අ. 0, රූ. 0. පර්. 6.95) විශාල ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2850/210 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

මෙලෙස විස්තර කරනු ලබන මාර්ග වෙන්කර තුළින්, මතින් සහ ඔස්සේ යාමේ අයිතිය ද සහ අනෙකුත් අයිතීන් ද ඇතුළුව ය.

1. බලයලත් මිනින්දෝරු එච්. එච්. සුහසිංහ විසින් 2004 මැයි මස 28 වැනි දින සාදන ලද අංක 2142 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී පිටකෝට්ටේ පිහිටි ''ගොරකගහකුඹුර'' සහ ''දෙනිය කුඹුර'' කියන ඉඩමේ බෙදා වෙන් කළ ලොට් 5 මාර්ග වෙන්කරය ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1, 2 සහ 3 ද, නැගෙනහිරට : මෙහි ලොට් 4 ද, දකුණට : මෙහි ලොට් 6 (කාණුව සඳහා වෙන්කරය) ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් 1996 අගෝස්තු මස 27 වැනි දින සාදන ලද අංක 156 දරන පිඹුරෙහි සඳහන් ලොට් B1, B2, B3 සහ B4 ද යන මායිම් තුළ එකී පිඹුරේ අංක 2142 පරිදි පර්චස් හතරයි දශම අටයි අටක් (අ. 0, රූ. 0, පර්. 4.88) හෝ හෙක්ටයාර් 0.01234 ක් විශාල ඉඩම නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2850/211 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. බලයලත් මිනින්දෝරු එච්. එච්. සුහසිංහ විසින් 2004 මැයි මස 28 වැනි දින සාදන ලද අංක 2142 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී පිටකෝට්ටේ පිහිටි ''ගොරකගහකුඹුර'' සහ ''දෙනිය කුඹුර'' කියන ඉඩමේ බෙදා වෙන් කළ ලොට් 6 (අගල සඳහා වෙන්කරය) ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 5 (මාර්ගයක් සඳහා වෙන්කරය) සහ මෙහි ලොට් 4 ද, නැගෙනහිරට : නාගරික සංවර්ධන අධිකාරියට අයත් දේපළ ද, දකුණට : නිහාල් රත්නායකගේ දේපළ සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් 1996 අගෝස්තු මස 27 වැනි දින සාදන ලද අංක 156 දරන පිඹුරෙහි සඳහන් ලොට් B1, B2, B3 සහ B4 ද යන මායිම් තුළ එකී පිඹුරුපත් අංක 2142 පරිදි පර්චස් එකයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 1.35) හෝ හෙක්ටයාර් 0.00341 ක් විශාල ඉඩම නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2850/212 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

3. බලයලත් මිනින්දෝරු එච්. එච්. සුහසිංහ විසින් 2004 මැයි මස 28 වැනි දින සාදන ලද අංක 2142 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී පිටකෝට්ටේ පිහිටි "ගොරකගහකුඹුර" සහ "දෙනිය කුඹුර" කියන ඉඩමේ බෙදා වෙන් කර ලොට් 7 මාර්ගයක් සඳහා වෙන්කරය ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 6 (අගල සඳහා වෙන්කරය) ද, නැගෙනහිරට : නිහාල් රත්නායකගේ දේපළ ද, දකුණට : ගල්වල පාර ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් 1996 අගෝස්තු මස 27 වැනි දින සාදන ලද අංක 156හි ලොට් B1, B2, B3 සහ B4 ද යන මායිම් තුළ එකී පිඹුරු පත් අංක 2142 පරිදි පර්චස් නවයයි දශම එකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 9.13) හෝ හෙක්ටයාර් 0.02309 ක් විශාල ඉඩම. නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2850/213 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

07-274

---

## මහජන බැංකුව - මොණරාගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.01.25 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහජන බැංකුව වෙනුවෙන් මොණරාගල ප්‍රසිද්ධ නොතාරිස් ජී. විජේතුංග මයා විසින් සහතික කරන ලද 2006.12.15 වැනි දිනැති අංක 3519 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අංක 39සී හුලංදාව වම, මොණරාගල පදිංචි ජයවර්ධන ඒකනායකගේ රොෂාන් චමින්ද ඒකනායක සහ දංගොල්ල ගෙදර ශාන්ති කුමාරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3519 දරන උකස්කරය යටතේ රුපියල් නවලක්ෂ පනස් අටදහස් දෙසිය පනහක (රු. 9,58,250) මුදලක් මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, එකී රුපියල් නවලක්ෂ පනස් අටදහස් දෙසිය පනහක් (රු. 9,58,250) සඳහා 2007.09.16 වැනි දින සිට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවා ද අඩු කරගෙන අදාළ මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 3519 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ බුත්තල, වැදිරට කෝරළයේ, වැදිකුඹුර ගමේ පිහිටා ඇති "ගලේඅරාව" නමැති ඉඩමට බලයලත් මානක පී. බී. ඉලංගසිංහ මහතා විසින් 2005.12.22 දින මැන සම්පාදිත අංක මො/1227 දරන සැලැස්ම ප්‍රකාර අංක 1 දරන කැබැල්ලට මායිම්, උතුරට : පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ අංක මො/1225 දරන සැලැස්මේ කැබලි අංක 01 ද, බස්නාහිරට : පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ.

මෙකී ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල් 52/159 දරන පත්‍ර්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එම්. එස්. බී. රත්නායක,
ප්‍රාදේශීය කළමනාකරු,
මොණරාගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

07-331

---

## මහජන බැංකුව - ජාඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.25 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2008.07.17 දිනැති අංක 13679 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සුන්දර රාජා ටෙරන්ස් සුතාගරන් නොහොත් සුන්දර රාජා සුදාගරන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පනස්ලක්ෂ හතලිස් හයදහස් හයසිය විසි හතරයි ශත තිස්තුන (රු. 50,46,624.33) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.10.23 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් පනස්ලක්ෂ හතලිස් හයදහස් හයසිය විසි හතරයි ශත තිස්තුන (රු. 50,46,624.33) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස්ලක්ෂ හතලිස් හයදහස් හයසිය විසි හතරයි ශත තිස්තුන (රු. 50,46,624.33) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 13679 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභා බල සීමාවේ බටගම දකුණ ගමේ පිහිටි

සිරිලෙන එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් 1992.03.30 වැනි දින මැන සකස් කළ පිඹුරු අංක 1093 දරන පිඹුරට අනුව ලොට් අංක 9 දරන බිම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 4168හි ලොට් 10 (පාර සඳහා වෙන් කළ කොටස) ද, නැගෙනහිරට : ලොට් 10 ද, දකුණට : මර්සලීන්ට අයත් ඉඩම ද , බස්නාහිරට : ලොට් අංක 11 සහ 8 යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම හතර (අ. 0, රූ. 0, පර්. 14.4)ක් විශාල ඉඩම සහ ගහකොළ, ගොඩනැගිලි ඇතුළු සියලු දේද සමගින් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B675/154 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙකී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස් හි මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

07-328

---

## යූනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

යූනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් හි (මෙහි මින් මතු යූබීසී වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 පෙබරවාරි මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කඹුරුපිටිය, තුම්බෙ "රත්නශිලා" හි පදිංචි කළුආරච්චි කන්කානම්ගේ අනුර (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) යන අය ස්වකීය ජංගම ගිණුමෙන් ණය, අත්තිකාරම් සහ අයිරා ආකාරයෙන් කලින්කලට බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී ණය, අත්තිකාරම් සහ අයිරා මත යූබීසී වෙත පිළිවෙලින් අයවිය යුතු රුපියල් හැත්තෑ පන්ලක්ෂයක (රු. 75,00,000) මුදල සහ රුපියල් විසිලක්ෂයක (රු. 20,00,000) මුදල හා ඒ මත ගෙවිය යුතු පොළිය ද, ගෙවීම සඳහා ඇපයක් ආකාරයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ එකී උකස්කරු විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් සරත් ප්‍රිය සෙනරත් විසින් ලියා සහතික කරන ලද අංක 5679 හා 2010.10.03 දරන මූලික උකස් බැඳුම්කරය හා අංක 5681 හා 2008.10.03 දරන මූලික උකස් බැඳුම්කරය ලියා අත්සන් කිරීමෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී ණය, අත්තිකාරම් හා අයිරා පහසුකම් මත ඉහත කී උකස්කරුගෙන් 2009.10.07 වැනි දිනට යූබීසී වෙත කාලීන ණය මත හිඟ මුදල ලෙස රුපියල් හැත්තෑහයලක්ෂ දහනවදහස් හාරසිය තිස්නවයකුත් ශත හතරක් (රුපියල් 76,19,439.04) මුදලින් ද, අයිරා පහසුකම් මත හිඟ මුදල ලෙස රුපියල් විසිඑක්ලක්ෂ තිස්හතරදහස් එකසිය දොළහකුත් ශත හැටක (රු. 21,34,112.60) මුදලින් ද, සමන්විතවන රුපියල් අනූහත්ලක්ෂ පනස්තුන්දහස් පන්සිය පනස්එකකුත් ශත හැට හතරක (රු. 97,53,551.64) මුදලක් සහ 2009 ඔක්තෝබර් මස 08 වැනි දින සිට ඒ මත වර්ෂයකට 29% බැගින් පොළියක් ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති බැවින් ද,

යූනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ඔවුන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාකරමින් ද, එකී උකස්කරු ඉහත කී ණය අත්තිකාරම් සහ අයිරා මත පොළිය ගෙවීම පැහැර හැරීම සිදු කර ඇති බවට සෑහීමකට පත්වීමෙන් ඉනික්බිතිව ද, කාලීන ණය මත හිඟ මුදල වන රුපියල් හැත්තෑහයලක්ෂ දහනවදහස් හාරසිය තිස්නවයකුත් ශත හතරක (රුපියල් 76,19,438.04) මුදලින් ද, අයිරා පහසුකම මත හිඟ මුදලවන රුපියල් විසිඑක්ලක්ෂ තිස්හතරදහස් එකසිය දොළහකුත් ශත හැටක (රු. 21,34,112.60) මුදලින් ද සමන්විත වන රුපියල් අනූහත්ලක්ෂ පනස්තුන්දහස් පන්සිය පනස්එකකුත් ශත හැටහතරක (රුපියල් 97,53,551.64) මුදල හා 2009 ඔක්තෝබර් මස 08 වැනි දින සිට ඒ මත වර්ෂයකට 29% බැගින් පොළිය ද, 1990 අංක 04 දරන ඉහත කී පනතේ 13 වැනි වගන්තිය යටතේ ඉහත එකී අංක 5679 හා 5681 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් විසින් අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද, අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5679 දරන උකස් බැඳුම්කරය සහ ඉහත කී අංක 5681 දරන උකස් බැඳුම්කරය යටතේ හා එහි බලය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් වෙත උකසට තබන ලද දේපළ 1990 අංක 04 දරන ඉහත කී පනත ප්‍රකාරව බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා බලය පැවරීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### ඉහත කී පළමුවැනි උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබොඩ පත්තුවේ, වේපතඉර පිහිටි රොටුම්බගේවත්ත හෙවත් මැටිහක්කවත්ත කැටකැලවත්ත හෙවත් දිවෙල්කැටකැලවත්ත TP 243161හි මොරකැටියහේන සහ ටී. පී . 247558හි මොරකැටිය යන ඒකාබද්ධ කරන ලද ඉඩම්වලට බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. පී. ගුණතිලක විසින් මැන සාදන ලද අංක 457 සහ 1998.01.19 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 01 නමැති බෙදා වෙන් කළ ඉඩමට, මායිම් උතුරට : කිරිගහහේන, FVP 184හි ලොට් 59, FVP 184හි ලොට් 59P, කැටකැලදෙනිය, FVP 184හි ලොට් 18 ද, නැගෙනහිරට : FVP 184හි 59F බෝගහකොරටුව, වේපතඉර ගම, මාරාගස්කොරටුව හෙවත් හිරිකැටිය ද, දකුණට : ගමේ මායිම සහ FVP 184හි ලොට් 59Q, බස්නාහිරට : කැටකැලදෙණිය, FVP 184හි ලොට් 18, FVP 184හි ලොට් 59Q, පීල්ලේදොල හෙවත් සිංගාරදොළ සහ කිරිගහහේන ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 457 දරන පිඹුර අනුව අක්කර අටයි රූඩ් එකයි පර්චස් තිස්අටයි දශම පහක් (අ. 8. රූ. 1, පර්. 38.5) හෙවත් හෙක්ටයාර් 3.436033 විශාල බිම් කැබැල්ල සහ එහි පස ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

#### ඉහත කී දෙවැනි උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවැද්දුව පිහිටි අඹගහහේන හෙවත් අසමෝදගන්හේන සහ ඇටඹගහහේන නමැති ඒකාබද්ධ කරන ලද ඉඩම්වලට මිනුම්පති විසින් සහතික කරන ලද අංක Mara 578 (LRC Co. 1130/mA/4) දරන මුල් පිඹුරේ නිරූපිත ලොට් 01

නමැති බෙදා වෙන් කළ බිම් කැබැල්ලට මායිම්, උතුරට : TP 200656 සහ TP 211518හි ඇටඹගහහේන ද, නැගෙනහිරට : පීල්ලදොල ද, දකුණට : PP 14208/1G, PP14208/1C, PP14208/1B, PP14208/1A හා PP 14208/1C ද, බස්නාහිරට : මහහේන හෙවත් වවුලගලහේන, ගම්සභා පාර, ඉහලදෙණිය සහ ඉහලවත්ත ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී Mara 578 මු. පිඹුරු අනුව අක්කර විස්සයි, පර්චස් පහයි දශම පහක් (අ. 20, රූ. 0, පර්. 5.95) විශාල බිම් කැබැල්ල හා ඊට අයිති පස, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ B447/190 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එච්. පී. නන්දසිරි විසින් මැන සාදන ලද අංක 91/2006 හා 2006.08.25 වැනි දින දරන මෑත කාලීන මිනුම් පිඹුර අනුව ඉහත කී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ :-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවැද්දුව පිහිටි අඹගහහේන හෙවත් අසමෝදගන්හේන සහ ඇටඹගහහේන නමැති ඒකාබද්ධ කරන ලද ඉඩම්වලට ඉහත කී අංක 91/2006 දරන පිඹුරේ ලොට් 1, 2 සහ 3 වශයෙන් නිරූපිත ලොට් 1 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : පීල්ලදොල TP 200656 TP 211518හි ඇටඹගහහේන සහ කඩවැද්දුව සිට පාර ද, නැගෙනහිරට : පීල්ලදොල සහ PP 14208/1G, PP 14208/1, PP 14208/1B සහ PP 14208/1A ද, දකුණට : PP 14208/1G, PP 14208/1C, PP 14208/1B, PP 14208/1A සහ PP 14208/1C ද, බස්නාහිරට : ඊ. විජේකෝන් සහ වෙනත් අය අයිතිවාසිකම් කියන මහහේන හෙවත් වවුලගලහේන, කඩවැද්දූවේ සිට පාර එන්. ඒ. ජයතිස්ස සහ වෙනත් අය අයිතිවාසිකම් කියන ඉහළදෙනිය, කේ. ඩබ්ලිව්. මින්සන් සහ වෙනත් අය අයිතිවාසිකම් කියන ඉහළවත්ත ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 91/2006 දරන පිඹුර අනුව අක්කර දහනවයයි රූඩ් තුනයි පර්චස් හතරයි දශම හයයි දෙකක් (අ. 19, රූ. 3, පර්. 4.62) හෙවත් හෙක්ටයාර් 8.00423 ක් විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති පස, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-280

---

## සම්පත් බැංකුව පීඑල්සී

(කලින් සීමාසහිත සම්පත් බැංකුව ලෙස හැඳින් වූ)

### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ජී. කේ. එම්. ඒ. කේ. විජේබණ්ඩාර, ජී. කේ. එම්. එස්. කේ. විජේබණ්ඩාර සහ බී. බී. ටිකිරි බණ්ඩා.
ගිණුම් අංකය : 1056 5002 2633.

2008 මාර්තු මස 27 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රිදීමාලියද්ද 8 වැනි සැතපුම් කණුවෙහි පදිංචි අයවලුන්වන ගමගේ කෝණාර මුදියන්සේලාගේ අජිත් කුමාර විජේබණ්ඩාර, ගමගේ කෝණාර මුදියන්සේලාගේ සරත් කුමාර විජේබණ්ඩාර සහ බලවත් බණ්ඩාරලාගේ ටිකිරි බණ්ඩා යන තිදෙනා බන්ධනදායීන් වශයෙන් සහ ඉහත කී රිදීමාලියද්ද 8 වැනි සැතපුම් කණුව පදිංචි ගමගේ කෝණාර මුදියන්සේලාගේ අජිත් කුමාර විජේබණ්ඩාර යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්. ජයවීර විසින් සම්පත් බැංකුව පීඑල්සී හි නමට ලියා සහතික කළ 2004 අප්‍රේල් මස 22 දාතම හා අංක 2659 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2007 ජූලි මස 30 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන්ලක්ෂ දාහත් දහස් හත්සිය නවයයි ශත හතලිස් අටක් (රු. 3,17,709.48ක් පමණයි) එකී බැඳුම්කරය මත සම්පත් බැංකුව පීඑල්සීට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් තුන්ලක්ෂ දාහත් දහස් හත්සිය නවයයි ශත හතලිස් අටක (රු. 3,17,709.48ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් තුන්ලක්ෂ පන්දහස් අනූ එකක් සහ ශත හතලිස් හයක (රු. 3,05,091.46ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට නවයයි දශම පහක් (9.5%) බැගින් 2007 ජූලි මස 31 වැනි දින සිට විකුණුම් දින තෙක් තවදුරටත් පොළී මුදල් ද සමග එකී අංක 2659 උකස් බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ මුදල පියවා නිමවන දින තෙක් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී 2659 බැඳුම්කරය මත සම්පත් බැංකුව පීඑල්සීට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### ඉහත සඳහන් උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝට්ඨාසයේ අරළුපිටිය කෝරළයේ, රිදීමාලියද්ද වසම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කණුගොල්ල යන ගම පිහිටා ඇති මූකලානවත්තහේන සහ මූකලානවත්ත ඉඩම සඳහා එච්. එම්. සමරනායක බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සකස් කරන ලද අංක 4731 හා 2003 අගෝස්තු මස 19 දිනැති සැලැස්මේ ලොට් අංක 1 ලෙස දක්වා ඇති උතුරට : ජේ. කේ. ඉන්ද්‍රාණිට අයත් ඉඩම ද, නැගෙනහිරට : දෙයියන්නෙවෙල වාරිමාර්ග ඇළ ද, දකුණට : කේ. එච්. ඉන්ද්‍රාණිට අයත් ඉඩම ද, බටහිරට : පාරක් හා පාරක් සඳහා වෙන් කළ කොටසින් ද යන මායිම් තුළ පිහිටි අක්කර එකක්, රූඩ් දෙකක් (අ. 1, රූ. 2, පර්. 0) වන බිම් කොටස අංක 4731 දරන සැලැස්ම ප්‍රකාරව හා බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E45/10 යටතේ ලියාපදිංචි කොට ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම හා එහි පස්, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි අනෙකුත් සියලු දේ සහ එයට අයත් සියලු අයිතීන්, මාර්ග වරප්‍රසාද, සහන හා පරවශතා අයිතීන් ද සමග ය.

ඉහත කී අම්පිටිය ගම පිහිටි අංක 2245 හා 1999 නොවැම්බර් මස 30 හා 1999 ජුනි මස 15 දිනැති සැලැස්මේ ලොට් අංක 7 දරන (අඩි 16ක් පළලැති මාර්ග සඳහා වෙන් කළ බිම් තීරය), උතුරට : ශ්‍රී දළදා මාලිගාවේ උද්‍යානය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාරගේ 1964 ජනවාරි 07 දිනැති සැලැස්මේ ලොට් 8, 10, 11 හා 24 ද, දකුණට : ලොට් 2, 3, 5 සහ 6 ද, බටහිරට : ලොට් 12 සහ 14 ද මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 15.50) වන බිම් කොටස අංක 2245 දරන සැලැස්ම ප්‍රකාරව හා මහනුවර ඉඩම්

ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A351/155 යටතේ ලියාපදිංචි කොට ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ලොට් අංක 07 දරන (අඩි 16ක් පළලැති පාර).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/14

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(කලින් සීමාසහිත සම්පත් බැංකුව ලෙස හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එලයිට් හෝසියරි.
ගිණුම් අංකය : 0001 1005 8187.

2005 සැප්තැම්බර් මස 01 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙහිවල, දුටුගැමුණු වීදියේ, අංක 100/1B හි පදිංචි ඉහත කී ජනරජයේ දෙහිවල, දුටුගැමුණු වීදියේ, අංක 100/1B හි එලයිට් හෝෂර යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ පවත්වාගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකාරියවන ශාන්තිනී ද අල්විස් සිරිසේන යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. ගමලත් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 නොවැම්බර් මස 07 දාතම හා අංක 371 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2005 මැයි මස 30 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ විසිතුන් දහස් එකසිය තිස් හතයි ශත තිස් හතක (රු. 8,23,137.37) මුදල් ප්‍රමාණයක් අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ විසිතුන් දහස් එකසිය තිස් හතයි ශත තිස් හතක (රු. 8,23,137.37) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හයලක්ෂ හතලිස් එක් දහස් හාරසිය පහයි ශත හැත්තෑහතරක (රු. 6,41,405.74) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් 2005 මැයි මස 31 වැනි දිනය සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 731 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාවේ නාගරික කොට්ඨාස අංක 38, බම්බලපිටියේ, කොල්ලුපිටිය, ඩීන්ස්ටන් පෙදෙසේ පිහිටි දැනට වරිපනම් අංක 49A දරන (සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ සිට හා වෙතින්) බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1975 මැයි මස 30 දාතම හා අංක 2749 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත සහාධිපත්‍ය ඒකක 2, බිම් මහලේ ලොට් 3, (නැගෙනහිර කොටසේ නිවස්නය) වන කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සහාධිපත්‍ය A118/141හි ලියාපදිංචි කොට ඇති උතුරට : මෙම කට්ටිය සහ ලොට් 6 වෙන් කරන උතුරු බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම කට්ටිය සහ ලොට් 6 වෙන් කරන නැගෙනහිර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම කට්ටිය ලොට් 5 න් සහ 6න් වෙන් කරන දකුණු බිත්තියේ මධ්‍යය ද, සහ බටහිරට : මෙම කට්ටිය හා ලොට් 1 වෙන් කරන බටහිර බිත්තියේ මධ්‍යය ද, පහලට : වර්ග අඩි හත්සිය පහළොවක (වර්ග අඩි 715) ප්‍රමාණයෙන් යුතු මෙම කට්ටියේ බිම ද, සහ ඉහළට : පළමු මහලේ ලොට් අංක 4හි බිමෙහි මධ්‍යය ද මායිම්වන සහාධිපත්‍ය ඒකක 2 වේ.

පොදු මූලාශ්‍ර :

1. (අ) ගොඩනැගිල්ල පිහිටි ඉඩම.
   (ආ) ලොට් 6 වශයෙන් ලකුණු කොට ඇති ඉඩමේ ඉතිරි කොටස.
2. ගොඩනැගිල්ලේ අත්තිවාරම්, කුළුණු, බාල්ක, පරාල, ආධාරක, ප්‍රධාන බිත්ති සහ වහල.
3. පොදු භාවිතය සඳහා පවත්නා විදුලි සැපයුම්, ජල, මලාපවහන, කාණු සහ සියලු උපාංග.
4. දේපළ වටා පිහිටි ගේට්ටු සහ මේසන් තාප්ප.
5. දේපළෙහි පැවැත්මට, නඩත්තුවට සහ ආරක්ෂාවට අවශ්‍ය හෝ සුදුසු හෝ සාමාන්‍යයෙන් පොදුවේ භාවිත වන අනෙක් සියලුම කොටස් හා පහසුකම්.

එක් එක් ඒකකයට අදාලවන පොදු මූලාශ්‍ර බෙදා හදාගැනීමේ හා ඒවායේ ප්‍රතිශතය :

ඒකකය 2, ලොට් 3-භාගය 715/3100 ප්‍රතිශතය 23.1%

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාවේ, නාගරික කොට්ඨාස අංක 38, බම්බලපිටිය තුළ කොල්ලුපිටියේ, ඩීන්ස්ටන් පෙදෙසේ, පිහිටි ඩීන්ස්ටන් පෙදෙස වරිපනම් අංක 49 දරන බලයලත් මිනින්දෝරු අයි. ඩබ්ලිව්. ඩබ්ලිව්. ඉන්ද්‍රතිස්ස විසින් සාදන ලද 1949 මාර්තු මස 04 දාතම හා අංක 1452 පිඹුරේ නිරූපිත ලොට් X8A වශයෙන් ලකුණු කොට ඇති බිම් කොටසේ පිහිටි ඒකක 3 යටතේ වන එකී ලොට් 3, උතුරට : ඩීල් පෙදෙස වරිපනම් අංක 16 සහ 20 යන පරිශ්‍රයන් ද, නැගෙනහිරට : එකී අංක 1452 පිඹුරේ ලොට් X8B ද, දකුණට : ඩීන්ස්ටන් පෙදෙස ද සහ බටහිරට : ඩීන්ස්ටන් පෙදෙසේ වරිපනම් අංක 47 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම හතයි එකක් (අ. 0, රූ. 0, පර්. 14.71) වන බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි හා සමග ය. එකී අංක 1452 පිඹුර කොළඹ ඉඩම් කාර්යාලයේ A20/283හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/3

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ස්කයි ඊ - නෙට් කොම්පියුටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0030 1000 1136.

2004 දෙසැම්බර් මස 16 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව දුම්රියපල පාරේ, අංක 1/29 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ස්කයි ඊ-නෙට් කොම්පියුටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය බන්ධනදායින් වශයෙන් සහ රණවීර ආරච්චිලාගේ දොන් ජෝර්ජ් අප්පුහාමි යන අය උකස්කරු වශයෙන් වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 සැප්තැම්බර් මස 04 දාතම හා අංක 21054 සහ 2002 ඔක්තෝබර් මස 25 දාතම හා අංක 21290 දරන උකස් බැඳුම්කර මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2004 සැප්තැම්බර් මස 30 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාහත්ලක්ෂ පනස් එක් දහස් හාරසිය තිස් නවයයි ශත පනහක (රු. 17,51,439.50) මුදල් ප්‍රමාණයක් එකී බැඳුම්කර මත අයවිය යුතු සම්පූර්ණ හිඟ මුදල වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු හෙයින්, එකී රුපියල් දාහත් ලක්ෂ පනස් එක් දහස් හාරසිය තිස්නවයයි ශත පනහක (රු. 17,51,439.50) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් දහතුන් ලක්ෂ අනූහත් දහස් තුන්සිය දාහතරයි ශත හතලිස් හතරක (රු. 13,97,314.44) මුදල සඳහා වසරකට සියයට විසිහය (26%) බැගින් 2004 ඔක්තෝබර් මස 01 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල් ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී 21054 සහ 21290 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ මහ නගර සභා සීමාව ඇතුළත කුරණ දෙවන කොට්ඨාසයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 1993 ජූලි මස 09 දාතම හා අංක 1884/2 දරන පිඹුරේ නිරූපිත ගොයියාකුඹුරේ ලොට් 1C වශයෙන් හැඳින්වෙන උතුරට : එම පිඹුරේම ලොට් 1A, 1B සහ 2 ද, නැගෙනහිරට : මීගමුව මහ නගර සභාවට අයත් ඉඩම ද, දකුණට : ක්‍රිස්ටි පණ්ඩිතරත්න, ජෝශප් අප්පුහාමි සහ ඩෙරික් යන අයට අයත් ඉඩම් ද සහ බටහිරට : එන්. නිහාල් ප්‍රනාන්දුගේ ඉඩම (අඩි 10 පළල පාර සහ එම පිඹුරේ ලොට් 1A ද) මායිම් වන මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A225/234හි ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් තිස්හතරයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 34.23) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි තිබෙන සෑම සියලු දේ සමග ය.

එසේම මතු දැක්වෙන ඉඩම් ඔස්සේ හා මතින් මාර්ග අයිතිය ද සමග ය.

ඉහත කී අංක 1884/2 පිඹුරේ නිරූපිත ඉහත කී කුරණ, දෙවන කොට්ඨාසයේ පිහිටි ගොයියාකුඹුරේ ලොට් 1බී වශයෙන් දැක්වෙන උතුරට : බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දබරේරා විසින් සාදන ලද 1969 ජූලි මස 04 දාතම හා අංක 1502/1969 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : එකී අංක 1884/2 පිඹුරේ ලොට් 2 සහ 3 ද, දකුණට : ලොට් C1 ද සහ බටහිරට : ලොට් 1A ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම පහයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 4.52) වන මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A225/234හි ලියාපදිංචි කොට ඇති බිම් කොටස.

ඉහත කී අංක 1884/2 පිඹුරේ නිරූපිත කුරණ, දෙවන කොට්ඨාසය පිහිටි ගොයියාකුඹුරේ ලොට් 3 වශයෙන් දැක්වෙන, උතුරට : ඉහත කී අංක 1502/1969 පිඹුරේ ලොට් 1 සහ අඩි 10 පළල පාර ද, නැගෙනහිරට : මීගමුව මහ නගර සභාවට අයත් ඉඩම ද, දකුණට : එකී අංක 1884/2 පිඹුරේ ලොට් 2 ද සහ බටහිරට : ලොට් 1B ද මායිම් වන මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A225/265 හි ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 1.55) වන බිම් කොටස.

ඉහත කී අංක 1502/1969 පිඹුරේ නිරූපිත ඉහත කී කුරණ, දෙවන කොට්ඨාසයේ පිහිටි ගොයියාකුඹුරේ ලොට් 3 වශයෙන් දැක්වෙන, උතුරට : තලදූව පාර ද, නැගෙනහිරට : මීගමුව මහ නගර සභාවට අයත් ඉඩම ද, දකුණට : ඉහත කී අංක 1502/1969 පිඹුරේ ලොට් 2 ද සහ බස්නාහිරට : ඉහත කී අංක 1502/1969 පිඹුරේ ලොට් 1 ද මායිම් වන මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A225/198හි ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 5.2) වන බිම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. සුදර්ශන්,
සමාගමේ ලේකම්.

07-291/7

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

කේ. එම්. එම්. අයි. ඩී. තමෙල්
ගිණුම් අංක : 0030 5001 2912.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සීමාසහිත සම්පත් බැංකුව නමින් වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා යන අය විසින් ලියා සහතික කරන ලද 2002 නොවැම්බර් මස 20 දාතම හා අංක 21401 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන්

ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන්නප්පුව සියඹලාගස්හන්දිය "නෙළුම්" හි පදිංචි කොස්වත්ත මුහන්දිරම්ලාගේ මේරියන් ඉනෝකා දිල්හානි තමෙල් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ හැත්තෑ එක්දහස් නමසිය පනස්තුනයි ශත හතරක (රු. 2,71,953.04) මුදලක් 2005 මැයි 10 වැනි දිනට සිට එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙලක්ෂ හැත්තෑ එක්දහස් නමසිය පනස්තුනයි ශත හතරක (රු. 2,71,953.04) මුදල ද 2005 මැයි 11 වැනි දින සිට අංක 21401 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 1,75,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිතුනක් (23%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 21401 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුවේ පිහිටි මිල්ලගහවත්ත හි ලොට් 02 යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 ජුනි මස 10 දාතම හා අංක 2450 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉහත ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2450 දරන එකී පිඹුරේ ලොට් 01 සහ 03, නැගෙනහිරට : මාලනී පෙරේරා යන අයගේ ඉඩම, දකුණට සහ බස්නාහිරට : ජේ. කේ. ඩේවිඩ් පෙරේරා යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 14.4) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියළු දේ සහ එකී ලොට් 3 (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම) මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග වෙළුම/පත්ඉරුව G82/225 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-291/8

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එන්. පී. එස්. පද්මකුමාර.
ගිණුම් අංක : 0025 5001 3854.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :-

සීමාසහිත සම්පත් බැංකුව නමින් මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සී. බී. දෙහිගම යන අය විසින් ලියා සහතික කරන ලද 2006 මැයි මස 05 දාතම හා අංක 37245 සහ 2006 නොවැම්බර් මස 01 දාතම හා අංක 37604 දරන උකස් බැඳුම්කර දෙක උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහනුවර, අලවතුගොඩ, අංක 39හි පදිංචි නවරත්න පටබැඳිගේ සමන් පද්මකුමාර යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිතුන් ලක්ෂ විසිහතර දහස් නමසියයයි ශත අනූහතක (රු. 23,24,900.97) මුදලක් 2007 සැප්තැම්බර් මස 13 වැනි දිනට එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිතුන් ලක්ෂ විසිහතර දහස් නමසීයයයි ශත අනූහතක (රු. 23,24,900.97) මුදල ද 2007 සැප්තැම්බර් 14 වැනි දින සිට අංක 37245 සහ 37604 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහතුන්ලක්ෂ තිසිතුන් දහස් දෙසීයයක (රු. 13,33,200) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් වූ පොළිය ද, රුපියල් අටලක්ෂ හැත්තෑහතර දහස් අටසීයයක (රු. 8,74,800) මුදලක් සඳහා වාර්ෂික සියයට දහඅටක් (18%) බැගින් පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 37245 සහ 37604 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවිස් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර උඩගම්පහ සරසිය පත්තුවේ, අලවතුගොඩ පිහිටි "කොරකහගොල්ලේ හේන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. පානබොක්කේ යන අය විසින් සාදන ලද 1955 ජුනි මස 05 දාතම හා අංක 1006 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, නැගෙනහිරට : පී. ඩබ්ලිව්. ඩී. පාර, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස, උතුරට : පී. යූ. ජයසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩමේ පහළ කොටස සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් විස්සක් (අ. 0, රූ. 2, පර්. 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, වෙළුම/පිටුව එච්. 774/202 මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ඉඩම මාතලේ බලයලත් මානක තැන ඊ. වී. සිරිසුමන යන අය විසින් සාදන ලද 2003 ජනවාරි මස 08 දාතම හා අංක 3072 දරන මිණුම් පිඹුර මගින් මැත දී මැන ලොට් 1ඒ සහ 1බී යන දෙකම එකට යා කොට එක දේපළක් සාදා ඇති අතර ඊට මායිම්, ඊසානට : අංකුඹුර සිට අලවතුගොඩ දක්වා දිවෙන මාර්ගය, ගිණිකොණට : පී. ජේ. එස්. ජයසිංහ

සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම, නිරිතට : සිස්ටන් එස්ටේට් සහ වයඹට : ටිකිරා යන අය හිමිකම් කියනු ලබන එම ඉඩමෙන් කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 2, පර්. 20) විශාල ඉඩම සහ එහි වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-291/6

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ජී. ජී. රාජපක්ෂ නොහොත් ආර්. ජී. ගුණපාල නොහොත් ආර්. ජී. රාජපක්ෂ, කේ. සෝමාවති සහ ඩී. එම්. ඩී. ප්‍රසන්න.
ගිණුම් අංකය : 0005 5004 7543.

2008 ජූලි මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දියතලාව ඇල්ලගම පසල්කන්ද, පදිංචි කංකානම්ලාගේ සෝමවති, දික්වත්තේගෙදර මර්තේනිස්ලාගේ දිමුත් ප්‍රසන්න සහ රාජපක්ෂගෙදර ගුණපාල යන තිදෙන බන්ධන්දායීන් වශයෙන් සහ ඉහත කී දියතලාව ඇල්ලගම පසල්කන්ද පදිංචි කංකානම්ලාගේ සෝමාවතී සහ දික්වත්තේගෙදර මර්තේනිස්ලාගේ දිමුත් ප්‍රසන්න යන දෙදෙන උකස්කරුවන් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනරි විසින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ සමාගම් අංක PQ 144 දරන දැන් සම්පත් බැංකුව පීඑල්සී නමින් හැඳින්වෙන සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 මැයි 25 දාතම හා අංක 477 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2008 මාර්තු මස 15 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හයලක්ෂ හැටඅටදහස් පන්සිය අසූ හයක් (රු. 6,68,586ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී වෙත අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී හයලක්ෂ හැටඅටදහස් පන්සිය අසූ හයක් (රු. 6,68,586ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් තුන්ලක්ෂ පනස් දහසක (රු. 3,50,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් 2007 සැප්තැම්බර් මස 04 වැනි දින සිට එකී අංක 477 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමා කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීමේ වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 477 දරන බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය, මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල සීමාව තුළ ඇල්ල අලුත්වෙල ගමේ පිහිටි "මහඉද්ද කපල්ල පතන" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු හා තලම්තිකරු පී. ඩබ්. නන්දසේන විසින් මැන සාදන ලද 2004 නොවැම්බර් මස 11 දාතම හා අංක 5519 දරන පිඹුරේ ලොට් 1265 ලෙස ලකුණු කොට නිරූපිත උතුරට : FVP 387 පිඹුරේ ලොට් අංක 1269 හා 1261 ද, නැගෙනහිරට : FVP 387 පිඹුරේ ලොට් අංක 1261, 1260, 1259 හා 1266 ද, දකුණට : FVP 387 පිඹුරේ ලොට් අංක 1266, 1267 හා 1268 ද, බටහිරට : FVP 387 පිඹුරේ ලොට් අංක 1268 හා 1269 ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් හතරක් (අ. 0, රූ. 1, පර්. 4) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග ය.

ඉහත කී අංක 5519 දරන පිඹුරේ ලොට් 1265 පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිනුමකි. ඉහත කී ඇල්ල අළුත්වෙල ගමේ පිහිටි "මහඉද්ද කපල්ල පතන" නමැති ඉඩමෙන් මිනුම්පති විසින් සහතික කළ 1989 ජුනි මස 13 දාතම හා FVP 387 දරන පිඹුරේ ලොට් 1265 ලෙස ලකුණු කොට නිරූපිත බදුල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව L. D. O. HP 02/129 යටතේ ලියාපදිංචි කළ, උතුරට : FVP 387 පිඹුරේ ලොට් අංක 1269 හා 1261 ද, නැගෙනහිරට : FVP 387 පිඹුරේ ලොට් අංක 1261, 1260, 1259 සහ 1266 ද, දකුණට : FVP 387 පිඹුරේ ලොට් අංක 1266, 1267 හා 1268 ද, බටහිරට : FVP 387 පිඹුරේ ලොට් අංක 1268 හා 1269 ද මායිම් වන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි එකයි දෙකක් (හෙක්. 0.112) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොට එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සුගත් චන්දන මල්වත්ත - ගිණුම් අංක 0056 5000 0716
ෂාන් එම්පෝරියම් - ගිණුම් අංකය : 0056 1000 0721.

2008 අගෝස්තු මස 28 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

මහියංගන නව නගරයේ අංක 23 ''ෂාන් එම්පෝරියම්'' යන නමින් හා ශෛලියෙන් පවත්වාගෙන යන ව්‍යාපාරයේ ප්‍රධාන හිමිකරු වන සුගත් චන්ද්‍රන මල්වත්ත යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි විසින් සම්පත් බැංකුව පීඑල්සී හෝල්ඩින්, සමාගමේ අංක PQ144 යන නමට ලියා සහතික කළ 2004 නොවැම්බර් මස 10 දාතම හා අංක 219 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහියංගන නව නගරයේ අංක 23 ''ෂාන් එම්පෝරියම්'' නමින් හා ශෛලයෙන් පවත්වාගෙන යන ව්‍යාපාරයේ ප්‍රධාන හිමිකරු වන සුගත් චන්ද්‍රන මල්වත්ත යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. බණ්ඩාර විසින් 2007 අංක 07දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ සම්පත් බැංකු පී. එල්. සී. සහ සමාගම් අංක PQ144 දරන හෝල්ඩින් යන නමට ලියා සහතික කළ 2006 මාර්තු මස 20 දාතම හා අංක 105 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උප ලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැර ඇත.

එලෙස ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2008 අප්‍රේල් මස 29 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් මිලියන තුනයි නවලක්ෂ අසූතුන් දහස් පන්සිය පනස් පහයි ශත එකොළහක් (රු. 39,83,555.11 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හා හිඟව ඇති හෙයින් එකී රුපියල් මිලියන තුනයි නවලක්ෂ අසූතුන් දහස් පන්සිය පනස් පහයි ශත එකොළහක (රු. 39,83,555.11ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දෙමිලියන නවලක්ෂ අසූනව දහසක (රු. 29,89,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනක් (13%) බැගින් පොළිය ද, තවත් රුපියල් හත්ලක්ෂ විසිහය දහස් තුන්සිය අසූතුනයි ශත හතක (රුපියල් 7,26,383.07ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් 2008 අප්‍රේල් මස 30 වැනි දින සිට විකුණුම් දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වේතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් වේ නම් අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත සඳහන් අංක 219 සහ 105 දරන ණය බැඳුම්කර දෙක මත සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝරළයේ, මහියංගන කොට්ඨාසයේ, මහියංගන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සොරබොර ගමේ පිහිටි සොරබොර කොළණිය නම් වූ ඉඩමට එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර බලයලත් මානක තැන විසින් මැන සකස් කළ අංක 3223 හා 1995 මැයි මස 06 දිනැති සැලැස්මේ උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : ටොපෝ පී. පී. 57 ලොට් අංක 1024 ද, දකුණට : ටොපෝ පී. පී. 57 ලොට් අංක 1036 ද, බටහිරට : ලොට් අංක 3 හා 1 ද වශයෙන් මායිම් වූ ලොට් අංක දෙකට අයත් අංක 3223 සැලැස්මේ සඳහන් බදුල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එල්. ඩී. ඕ. එම්ජ් 09/286 හි ලියාපදිංචි කරන ලද රූඩ් තුනයි පර්චස් පහක් (අ. 0, රූ. 3, පර්. 5) විශාලැති සම්පූර්ණ ඉඩම එහි පස ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, අයිතින් වරප්‍රසාද හා මාර්ග අයිතීන් ද සමග තව ද, අංක 3223 සැලැස්මේ ලොට් 3 ලෙස සඳහන් බෙදා වෙන්කොට නිර්ණය කළ බිම් කොටස මතින් හා ඒ හරහා මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-291/16

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2010.04.27 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී :-

1. මහජන නොතාරිස් එන්. සී. බුලත්සිංහල විසින් සහතික කරන ලද 2007.06.01 දිනැති අංක 604 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.10.20 දින තෙක් පොලිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ අනූ හතර දහස් අටසිය දෙකයි ශත හැටඑකක (රු.3,94,802.61) මුදලක් සමග රුපියල් තුන්ලක්ෂ හැටහය දහස් අටසිය දහඅටයි ශත හතලිස් හතක (රු.3,66,818.47) මුදලක් මත වසරකට සියයට විසිහතරයි දශම පහයි පහ (24.75%) බැගින් පොලියක් ද, 2009.10.21 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පලාගල, මිරිහන්පිටිගම හි පදිංචි සුබසිංහ ආරච්චිලාගේ ප්‍රදීප් නන්දන සුබසිංහ මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 604 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් අටසිය දෙකයි ශත හැටඑකක (රු.3,94,802.61) මුදල සමග 2009.10.21 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට, එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, ගල්කිරියගම ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලගම් පළාත දකුණේ අංක 691 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග/හල්මිල්ලෑවැව ග්‍රාමයේ පිහිටියා වූ ද අංක 1016(113/92/1016) හි 15 දරන පිඹුරේ කැබලි කර විස්තර කර ඇති "එස්ටේට් ලෑන්ඩ්" නමැති ඉඩම් කැබැල්ල උතුරට : එම්. පී. කල්‍යාණවතීගේ ඉඩම

ද, නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණට : එල්. පී. පද්මසීලිගේ ඉඩම ද, බස්නාහිරට : කැකිරාව - ගලේවෙල ප්‍රධාන පාර ද, මායිම්ව අක්කර දෙකක (අ. 2, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණය සමග එහි ඇති ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 651/66 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2006.11.07 දිනැති අංක 2006/An/250 දරන මෑත කාලයේ මිනුම් පිඹුර අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී ගම්සභා හල්මිල්ලෑව හි පිහිටි "ගොඩඉඩම" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2006 නොවැම්බර් මස 07 දිනැති අංක 2006/An/250 දරන පිඹුරේ විස්තර කළ ලොට් අංක 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : එම්. පී. කල්‍යාණවතීගේ ඉඩම ද, නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණට : එල්. පී. පද්මසීලිගේ ඉඩම ද, බස්නාහිරට : කැකිරාව - ගලේවෙල ප්‍රධාන පාර ද, මායිම්ව අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්.0) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම අටයි බිංදුවයි නවයයි හතරක (හෙක්. 0.8094) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. කේ. කේ. එම්. කරුණාරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
ගල්කිරියාගම ශාඛාව.

07-277

---

**කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1750008038 සහ 1750016268
ණය ගිණුම් අංකය : 494579.
රන්දීර් මන්ජුල විතාන
මන්දාකිනි හෝල්ඩිංන්ස් හි තනි අයිතිකරු.

2010 පෙබරවාරි මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවර්ධන විසින් 2006 මැයි මස 05 වැනි දින සහතික කරන ලද අංක 2690 සහ 2008 පෙබරවාරි මස 28 වැනි දින සහතික කරන ලද දැන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැංක් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර අංක 3772 යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මන්දාකිනි හෝල්ඩිංන්ස් යන නාමය සහ විලාශයෙන් තනි අයිතිකාර ව්‍යාපාර ආයතනයක් පවත්වාගෙන යන රන්දීර් මන්ජුල විතාන ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද, එසේම කොළඹ ප්‍රසිද්ධ නොතරිස් ආර්. කේ. ජයවර්ධන විසින් 2009 ජනවාරි මස 21 වැනි දින සහතික කරන ලද අංක 4199 දරන දැන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ ද අයවිය යුතු මුදල් ගෙවීම රන්දීර් මන්ජුල විතාන ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර යටතේ 2009 සැප්තැම්බර් මස 11 වන විට රුපියල් මිලියන හයකුත් හයසිය දොළොස් දහස් පන්සිය හැටහයයි ශත අනූ එකක (රු. 66,12,566.91) මුදලක් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හයකුත් හයසිය දොළොස් දහස් පන්සිය හැටහයයි ශත අනූ එකක (රු. 66,12,566.91) මුදල අයකර ගැනීම සඳහා 2009 සැප්තැම්බර් මස 12 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 63,36,418.97ක මුදල මත 22% වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද, දරන ලද වෙනත් ගාස්තු වෙතොත් ඒවා ද මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 2690, 3772 සහ 4199 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තර විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

1. බලයලත් මානක පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් 2002 අගෝස්තු මස 30 වැනි දින සාදන ලද අංක 2787 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ සීමාවන් තුළ දැදිගමුව වැලිපිල්ලෑවේ ඕවිට කියන ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 4 සහ පොදු ළිඳ ද, දකුණට : සුමනසේකරට අයත් පොකුණහේන පොදු ළිඳ ද සහ පාර ද සහ බස්නාහිරට : ලොට් 2 ද යන මායිම් තුළ පර්චස් විසිහතරයි දශම හයයි බිංදුවක් (අ. 0 , රූ. 0, පර්. 24.60) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1843/84 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. බලයලත් මානක පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් 2002 අගෝස්තු මස 30 වැනි දින සාදන ලද අංක 2787 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දැදිගමුව පිහිටි වැලිපිල්ලෑවේ ඕවිට කියන ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 4 ලෙස සලකුණු කොට ඇති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ 5 ද, දකුණට : එස්. ඒ. ප්‍රේමරත්න ට අයිති දේපළ (නමුත් වඩා නිවැරදිව එස්. ඒ. ප්‍රේමරත්න සහ සුමනසේකරගේ පොකුණහේන) ද, සහ බස්නාහිරට : ලොට් 3 යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1779/173 යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගාමේ ලේකම්.

07-275